# බස්නාහිර පළාතේ පළාත් සභාව
# மேல் மாகாண மாகாண சபை
# WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 ජුනි 18 වන අඟහරුවාදා**
2013 □ன் 18 செவ்வாய்க்கிழமை ஜ
Tuesday 18th June 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஶ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.40 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.40 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.40 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා / දිවුරුම
## MAKING AFFIRMATION/TAKING OATHS BY NEW MEMBERS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"ගරු අජිත් කුමාර මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීම හේතුකොටගෙන, මෙම පළාත් සභාවේ ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කය සඳහා ඇති වූ මන්ත්‍රී ධුර පුරප්පාඩුව සඳහා උතුවම් පතිරන්නැහැලාගේ චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා තේරී පත් වී ඇති බව මැතිවරණ කොමසාරිස්තුමා විසින් අංක 1813/26 දරන 2013.06.07 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබෙනවා.*

*ඒ අනුව චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා 2013.06.13 වන දින මා ඉදිරිපිටදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නිල ප්‍රතිඥාව දීමද සිදු කරනු ලැබුවා. චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාට පැමිණ අසුන් ගන්නා ලෙසට ගෞරවයෙන් මම ආරාධනා කරනවා."*

***අනතුරුව, අභිනව ගරු මන්ත්‍රීතුමා [චන්ද්‍රසෝම සරණලාල් මහතා ] සභා ගර්භයේ අසුන් ගන්නා ලදී.***
*Subsequently, the newly appointed Member[Chandrasoma Saranalal] took his seat in theCouncil Chamber*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මෙම අවස්ථාවේදී චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාට මාගේත්, මෙම සභාවේත් උණුසුම් සුභාශිංසන පිරිනමනවා.

අභිනව මන්ත්‍රීතුමා තේරී පත්වීම හේතුකොට ගෙන රීති ප්‍රකාරව විපක්ෂයේ ආසනවල සුළු වෙනස්වීමක් යථා කාලයේදී සිදු කිරීමට බලාපොරොත්තු වන බව කාරුණිකව දැනුම් දෙනවා.

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

**සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය :**

*"1987 අංක 42 දරන පළාත් සභා පනතේ 17 වන වගන්තිය අනුව පළාත් සභාව විසින් සම්මත කරනු ලැබ ඇති 2000 අංක 07 දරන පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල ප්‍රඥප්තියේ විධිවිධාන කෙරෙහි අවධානය යොමු නොකොට සභා ලේකම් කාර්යාලයේ තනතුරු කීපයක් සංශෝධනය කර තිබීම සම්බන්ධයෙන් 2013.06.04 දින පළාත් සභා රැස්වීමේදී මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා විසින් කරන ලද ප්‍රකාශය සම්බන්ධව කරුණු කෙරෙහි ගරු ආණ්ඩුකාරතුමාගේ අවධානය යොමු කර ඇති අතර, ඒ සම්බන්ධයෙන් සභා කටයුතු කාරක සභාවේ මාගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු අමාත්‍ය ගරු ජගත් අංගගේ අමාත්‍යතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමක් සහ සභා ලේකම්තුමාත්, ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ එතුමාගේ ප්‍රධානත්වයෙන් 2013.06.13 වන දින පැවැති රැස්වීමේදී අදාළ තනතුරු සම්බන්ධයෙන් වන තීරණ ප්‍රඥප්තියේ සඳහන් පරිදි සංශෝධනය කර දෙන ලෙස එම තීරණ අනුමත කර දෙන මෙන් ඉල්ලා සිටීමටත්, එතෙක් තනතුරු නාමයන් පෙර පැවැති ආකාරයෙන් භාවිතා කිරීමට හැකි වන සේ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කරන ලෙසත් ගරු ආණ්ඩුකාරතුමා විසින් දැනුම් දුන් බව මෙම අවස්ථාවේදී සභාවට දැනුම් දෙනවා."*

*ii*

***උපදේශක කාරක සභා පත් කිරීම් :***

*"අමාත්‍යාංශ උපදේශක කාරක සභා සඳහා 2013.06.18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් මා විසින් නම් කරනු ලැබ ඇති බව සභාවට දැනුම් දෙනවා."*

***කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරි මාර්ග, කර්මාන්ත හා පරිසර අමාත්‍යාංශය :***

*ගරු රෝස් ප්‍රනාන්දු*

*ගරු ලක්ෂමන් විජේමාන්න*

***සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා හා සභා කටයුතු අමාත්‍යාංශය :***

*ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්*

***ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය :***

*ගරු යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා*

*iii*

***සභා සම්මත වූ පෞද්ගලික මන්ත්‍රී යෝජනා : යොමු කිරීම්***

*"රාත්‍රී 11.00 තෙක් බස් සේවාවන් ලබා දෙන මෙන් ඉල්ලා සිටින 2013.04.09 දින සභා සම්මත පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර තිබෙනවා.*

*පොදු පහසුකම් රථගාල් මගින් ජනතාවගේ මුදල් අය කිරීම අහෝසි කරන මෙන් ඉල්ලා සිටිනු ලබන 2013.05.21 වන දින සභා සම්මත පෞද්ගලික මන්ත්‍රී යෝජනාව සුදුසු පියවර ගැනීම සඳහා බස්නාහිර පළාතේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කරනු ලැබ ඇති බව දැනුම් දෙනවා."*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම පිළිගන්නවා.

i. 2013.05.22 වන දින පැවැති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව

ii. 2013.06.04 සහ 2013.06.10 යන දිනවල පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තා.

**ගරු මහේෂ් අල්මේදා [කාරක සභාවේ ගරු සභාපති වෙනුවෙන්]**
Hon. Mahesh Almeda [On Behalf of Hon.Chairman of the Committee]

ගරු සභාපතිතුමනි, "*2013.06.04 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව*" මම සභාවට ඉදිරිපත් කරනවා.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, කාරක සභා රැස්වීම් වාර්තා පිළිගැන්වීම යටතේ පොඩි වචනයක් කථා කරන්න ඕනෑ. 2013.06.04 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීමේදී, ගරු ඔබතුමාගේ සභාපතිත්වයෙන් යුක්තව කැඳවනු ලැබුවා. එදා ඔබතුමා වේලාසනින් ගියා. කෙසේ වුණත් අපි න්‍යාය පත්‍රයට යොමු කළා අපේ සභා කාර්යාලයේ කාර්ය මණ්ඩලය සම්බන්ධ යෝජනාවට ප්‍රමුඛත්වය දෙන්න කියලා. මේක සම්මත වෙලා තිබෙනවා. යෝජනාවේත් තිබෙනවා. ඒක න්‍යාය පත්‍රයට පැමිණියේ නැත්තේ මොකද? ඇයි න්‍යාය පත්‍රයේ ප්‍රමුඛත්වය දුන්නේ නැත්තේ? න්‍යාය පත්‍රයේ නැත්තේ මොකද කියන එක අපි දැනගන්න කැමැතියි. එදා සභා කටයුතු අමාත්‍යවරයා සිටියා. ආණ්ඩු පක්ෂයේ සංවිධායක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම එදා සාකච්ඡාවට සම්බන්ධ වුණේ නැහැ. සභානායකතුමා හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා සිටියේ. අපි ඊට පසුව ඒ සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාත් එක්ක සාකච්ඡා කරලා - ඔබතුමන්ලා කවුරුත් සම්බන්ධ වුණේ නැහැ. ආණ්ඩුකාරතුමා ඒ ගැන ඊට පස්සේ තීන්දුවක් ගන්නා ලෙස -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ වුණාට අපේ සභා කටයුතු රැස්වීම හැල්ලුවට ලක් කිරීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. හැල්ලුවට ලක් කිරීමක් නොවෙයි. ඊට ඉහළින් ආණ්ඩුකාරතුමාගේ සාකච්ඡාව –

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ වාර්තාවේ තිබෙනවා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. ඒ සාකච්ඡාවට ඔක්කෝටම සම්බන්ධ වන ලෙස ඔබතුමන්ලාට අපි ආරාධනා කළා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමන්ලා මට පැය දෙකකට ඉස්සෙල්ලා ආරාධනා කරලා මටයි –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ආණ්ඩුකාරතුමාගේ නියෝගය ලැබුණේ –

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි හිටියේ ගම්පහටත් එහා දිවුලපිටියේ. පැය දෙකකට කලින් කියනවා, මට ආණ්ඩුකාරතුමාගේ කාර්යාලයට එන්න කියලා. අපිත් මන්ත්‍රීවරු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපේ මන්ත්‍රීවරු ඔක්කෝම සම්බන්ධ වුණා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එහෙමනම් ඉස්සෙල්ලා දැනගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් දුරකථනයෙන් තමයි ආණ්ඩුකාරතුමා ආරාධනා කළේ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

සභා කටයුතු රැස්වීම් වාර්තාවේ සඳහන් වුණු න්‍යාය පත්‍රයේ මුලටම ගෙනෙන්න කියූ යෝජනාව ඔබතුමන්ලා ගරු ආණ්ඩුකාරතුමාගේ නියමයෙන් අයින් කළා. කෙළින්ම කියන්න. ඒක කෙළින්ම කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය ඉහළයි.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හරි. ඒක කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි ඉතින්.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඉතින් මේකේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කියන්න දෙයක් නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම ඇහුවේ ඒ ප්‍රශ්නය විතරයි. මේ වාර්තාවේ සඳහන් වෙලා තිබෙනවා. මේ කියවන්න. මම කියවන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පැහැදිලිවම නියෝගය කිව්වා නේ?

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වාර්තාවේ කියලා තිබෙනවා ප්‍රමුඛත්වය ගන්න තීන්දු කළා කියලා. ඒකට සභා කටයුතු අමාත්‍යතුමා හිටියා. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා සිටියා. ඒ වාර්තාව සම්මත වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා ගරු ආණ්ඩුකාරතුමා මටත් ආරාධනා කළේ පැය දෙකකට කලින්. හැමෝටම. ගරු අමාත්‍යතුමාට. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමාට. සභානායකතුමාට.

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව පැහැදිලි කිරීමක් අවශ්‍යයි. ගරු ආණ්ඩුකාරතුමාට මේ ඕනෑම කාරක සභාවක් කැඳවීමේ බලය තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලය තිබෙනවා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

එතුමා කාරක සභාව කැඳවලා, ඒ කාරක සභාවේදී, නැවත කැඳවලා නැහැ. ඒ ගත්ත තීන්දුවක් ප්‍රකාරව තමයි මේ කටයුතු කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමන්ලා අපට කරන්න දෙයක් නැහැ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ආණ්ඩු පක්ෂයේ හෝ අපට හෝ සභාවේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙකුට බලයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බලයක් නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ වාර්තාව කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ තිබෙනවා. පැහැදිලිව තිබෙනවා, ඒ වාර්තාව.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

කාරක සභාවක් කියලා අපට කිව්වේ නැහැ. අපට කිව්වේ ආණ්ඩුකාරතුමා හමුවන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ගැන කියන්න දෙයක් නැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපට කිව්වේ ආණ්ඩුකාරතුමා හමුවන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩුකාරතුමාට ඕනෑම වේලාවක බලය තිබෙනවා මේ සභාව -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නොමඟ යවන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නොමඟ යැවීමක් නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

නොමඟ යවන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ සභාව නොමඟ අරින්න එපා. ඔබතුමා තමයි මේ සභාව නොමඟ අරින්නේ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒකට ආව මන්ත්‍රීවරු අපට නම් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ ඕනෑම කාරක සභාවක් කැඳවන්න ආණ්ඩුකාරතුමාට බලය තිබෙනවා. ආණ්ඩුකාරතුමා වශයෙන් ඕනෑම වේලාවක කැඳවන්න බලය තිබෙනවා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

පැමිණි මන්ත්‍රීවරුන් ටික සඳහන් කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ඊළඟ සභාවේදී කියන්න. වේලාව යනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ ගරු ඇමැතිතුමා. වෙලාව යනවා. සුනිල් විජේරත්න ගරු සභාපතිතුමා. සභා කටයුතු අමාත්‍ය ගරු ජගත් අංගගේ ඇමැතිතුමා. ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා. රෙහෙනසිරි වරාගොඩ ගරු මන්ත්‍රීතුමා. යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා. මන්ත්‍රීවරුන් පස් දෙනෙක් මෙයට සම්බන්ධ වුණා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා ඉන්නවාද? විපක්ෂයේ සංවිධායකතුමා ඉන්නවාද? කවුරුත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය නැහැ. පුළුවන් අය ආවා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

විපක්ෂයේ නියෝජනයක් නැහැ. අපට පැය දෙකකින් කථා කරලා ඔබතුමන්ලා තීන්දුවක් අරන් න්‍යාය පත්‍රයෙන් අයින් කරලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තීන්දුව ගන්න අපි සම්බන්ධ වුණා.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එහෙනම් ගරු සභාපතිතුමා අපි සභා කටයුතු රැස්වීම්වලට එන්න ඕනෑ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය නැහැ ඒක ඉතින්. මේක මේ කාලය ගන්න අවශ්‍ය දෙයක් නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි එහෙමනම් සභා කටයුතු රැස්වීම්වලට එන්න ඕනෑ නැහැ නේ එහෙමනම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක ඉතින් ඔබතුමාගේ තීන්දුවක්.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නරක පූර්වාදර්ශයක් යන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ ගරු මන්ත්‍රීතුමා. නරක පූර්වාදර්ශයක් නොවෙයි මේක.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මෙහි ඊළඟ වාර්තාව අනුව මෙය නිවැරදි වෙනවා. ඒ ප්‍රකාශය ඔබතුමා කළා නම් මම හිතන්නේ මේ ගැටලු මොකුත් මතු වෙන්නේ නැහැ. ඔබතුමා මේ සම්බන්ධව තත්ත්වය පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් කළා නම්, මේ කරුණු මතු වෙන්නේ නැහැ. ඊළඟ වාර්තාවේ තිබෙනවා. දෙවැනි වාර්තාව. ඒකේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක පැහැදිලි කරන්නම්. වාර්තාව දෙන්නම්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක සම්බන්ධව ඔබතුමා කරුණු පැහැදිලි කිරීමක් කළා නම් හරි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඒක ඊළඟ වාර්තාවේ කරන්නම්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මොකද, ගරු ආණ්ඩුකාරතුමාගේ සාකච්ඡාවේදී වුණු දේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි පැහැදිලි කිරීමක් කරන්නම්.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අරක න්‍යාය පත්‍රයට ඇතුළත් කළ යුතුයි කියන සභා කටයුතු තීන්දුව ඊට පස්සේ වෙනස් වූ ආකාරය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමක් ඔබතුමා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. පැහැදිලියි. ඒක මම කරන්නම්.

ගරු මන්ත්‍රීවරුන්ට පෙත්සම් ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

# පෙත්සම්
# PETITIONS

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, වත්තල, හේකිත්ත, අල්විස් වත්ත, රජයේ නිවාස, අංක 118 හි පදිංචි ඊ. ශීලා සිල්වා යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, බියගම, බණ්ඩාරවත්ත, නව නුවර පාර, අංක 160/10 හි පදිංචි කේ.ඩී. ශ්‍යාමලී යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදරිපත් කරනවා.

i. හොරණ, මිල්ලෑව හි පදිංචි කේ. ලසන්ත පෙරේරා යන අයගේ පෙත්සම හා පෝරුවදණ්ඩ, වගවත්ත හි පදිංචි ආර්.ඒ. නන්දසිරි යන අයගේ පෙත්සම සහ

ii. පෝරුවදණ්ඩ, රත්මන්ගොඩ, කපුවැටිය පාර, අංක 166/3 හි පදිංචි එස්.ජී. සුසිලාවතී යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# ORAL ANSWERS TO QUESTIONS

## කොළොන්නාව සමූපකාර සමිතිය : සභාපතිගේ ක්‍රියා කලාපය
## KOLONNAWA COOPERATIVE SOCIETY: MODE OF OPERANDI OF THE HON. CHAIRMAN

01.

**මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(01)13/07)**

අ. කොළොන්නාව සමූපකාර සමිතියට සමූපකාර කොමසාරිස් විසින් පත්කර ඇති සභාපතිවරායාගේ අදුරදර්ශී ක්‍රියා පිළිවෙත හේතුවෙන් රන් සම්මානයෙන් පිදුම්ලද, සමිතිය පරිහානියට ලක්වෙමින් පවතින බව පිළිගන්නේද ?

ආ. සභාපතිවරයා සමූපකාරය සතු වාහන ඇතුළු දේපළ අයථා ලෙස පරිහරණය කරන බව පිළිගන්නේද ?

ඇ. පාරිභෝගික හා ග්‍රාමීය බැංකු අංශ මූල්‍ය කඩා වැටීමකට ලක්ව ඇති බව පිළිගන්නේද ?

ඈ. බැංකු තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම් සේවක වැටුප් ගෙවීම් අර්බුදයකට පත්ව ඇති බව පිළිගන්නේද?

ඉ. ග්‍රාමීය බැංකු අංශයෙන් සමිතිය වසර 02 කට ලබාගෙන ඇති රුපියල් ලක්ෂ 300 ක ණය මුදලේ පොලිය හා වාරික රු. 5,914,201/- ගෙවා අයිරාව රුපියල් ලක්ෂ 500 දක්වා වැඩි කර වසර 10 කින් ආපසු ගෙවීමේ කාලය දීර්ඝ කරගෙන ඇති බව පිළිගන්නේද ?

ඊ. 2012.12.31 දිනට සමිතියේ ශුද්ධ පාඩුව රු. 1,012,132/- බව පිළිගන්නේද ?

උ. ජාතික සමූපකාර මණ්ඩලයේ තැන්පත් කර තිබූ ග්‍රාමීය බැංකු තැන්පතුව රු. 17,688,652/- ක මුදල කල්පිරීම හේතුවෙන් කොළොන්නාව මහජන බැංකුවේ ජංගම ගිණුමක තැන්පත් කළ බව පිළිගන්නේද ?

ඌ. එම මුදල් ද වියදම් කර අවසන් බව පිළිගන්නේද ?

එ. මෙම නිලධාරීන් සමිතියේ සියලු වත්කම් විනාශ කරන තෙක් සිටින්නේද ?

ඒ. සමිතිය සඳහා නිලවරණයක් නොපවත්වන්නේ මන්ද ?

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

අ. නැත.

ආ. නැත.

ඇ. නැත.

ඈ. නැත.

ඉ. ඔව්.

වර්තමාන පාලක මණ්ඩලය පත් කිරීමට පෙර ලබා ගෙන ඇති ණය මුදලේ වාරික හා පොලිය නොගෙවා තිබීම හේතුවෙන් ග්‍රාමීය බැංකු සංගමය විසින් එම සංගමයෙහි පවතින ස්ථාවර තැන්පත් මුදලින් හිලව් කර ගන්නා බවට

දැන්වීමෙන් පසුව පාලක මණ්ඩල තීරණය අනුව ණය මුදල අවුරුදු 10 ක කාලයක් සඳහා අලුත් කර ඇත.

ඊ. 2012 දෙසැම්බර් මස ලබා ඇති ශුද්ධ පාඩුව රුපියල් දස ලක්ෂ දොළොස්දහස් එකසිය තිස් දෙකකි. (රු.1,012,132/-)

උ. ඔව්.

ඌ. ග්‍රාමීය බැංකු අංශයේ ජංගම ගිණුමෙහි තැන්පත් කරන ලද මෙම මුදල් ග්‍රාමීය බැංකු අංශයෙහි උකස් අත්තිකාරම් ලබා දීම, තැන්පත් මුදල් ගෙවීම ඇතුළුව ග්‍රාමීය බැංකු අංශයෙහි කටයුතු සඳහා යොදවාගෙන ඇත.

එ. වත්කම් විනාශ කිරීමක් සිදු වී නැත.

ඒ. බස්නාහිර පළාත් සභාවේ සමුපකාර සමිති ප්‍රඥප්තියේ 60(3)(අ) වගන්තිය යටතේ තිදෙනෙකුගෙන් යුත් රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් 2012.07.25 දින සිට පත් කර ඇති අතර, ඔවුන්ගේ නිල කාලය 2013.07.25 දිනෙන් අවසන් වේ. එහෙයින් 2013.07.25 දිනට පෙර නිලවරණයක් පැවැත්වීමට කටයුතු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමා සභාව නොමඟ යවන ප්‍රකාශ ඉදිරිපත් කරන්න එපා. ඔබතුමා ගරු ආණ්ඩුකාරතුමාගේ රැස්වීමට එන්න බැහැයි කියලා දුරකථනයෙන් ප්‍රකාශ කරලා තිබෙනවා. ඔබතුමා විතරක් නොවෙයි. ආණ්ඩු පක්ෂයේ -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, පැය දෙකකින් එන්න මට ප්ලයිට් එකක් තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් ඔබතුමා දන්නේ නැහැයි කියලා - ඔබතුමා ප්‍රකාශ කරලා තිබෙනවා එන්න විධියක් නැහැයි කියලා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා ලැහැස්තිවෙලා රැස්වීම් දාගෙන අපට එන්න බැරි වුණාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලේකම්තුමාට දැනුම් දීලා තිබෙනවා. ඔබතුමා එහෙම ප්‍රකාශ කරන්න එපා. රැස්වීමට එන්න බැහැයි කියලා ඔබතුමා කියලා තිබෙනවා. ඔබතුමා සභාවට එවැනි ප්‍රකාශයක් කරන්න එපා. සභාව නොමඟ අරින්න එපා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

අභියෝග කරන්න බැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමන්ලාට හිත රිදෙනවා. මේ දාපු එක වෙනස් කළා නේ. ලැජ්ජයි නේ. සභාපතිතුමාට වරදක් නේ වුණේ දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ දැන් දැක්කේ. වැරැද්දක් නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි සේවකයින් වෙනුවෙන් කථා කළේ. කමක් නැහැ. නිලධාරීන් වෙනුවෙන් අපි කථා කළේ. කමක් නැහැ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

නිලධාරීන් වෙනුවෙන් කථාවක් නොවෙයි. අපි කථා කරන්නේ නීතිය ගැන. පළාත් සභාවේ තිබෙන ප්‍රඥප්තියක් බල රහිත කරන්න බැහැයි කියන තර්කය උඩ අපි කථා කළේ. මේ පළාත් සභාව වෙනුවෙන් කථා කළේ. කවුරුවක්වත් ප්‍රශ්නයක් හින්දා නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වැරැදි දේ හදා ගන්න එපැයි.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු විපක්ෂ නායකතුමා, මේ පූර්වාදර්ශය වැරැදියි. පළාත් සභාවේ ප්‍රඥප්තියකට අභියෝග කරන්න බැහැයි කියන තර්කය උඩ අපි කථා කළේ. ඒක නිසා තමයි අපි ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කළේ, කරුණාකර මේ කාරක සභාව කැඳවලා මේකට විසඳුමක් දෙන්න කියලා.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාම තමයි ඔබතුමාගේ නමින් යෝජනාව දාන්න කිව්වේ. මේක හෙළි කරන්න ඕනෑ. මේක හැන්සාඩ්ගත කරන්න.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා

Hon. Jagath Angage - Minister

ඒක හරි. සභා කටයුතු කාරක සභාවේ -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාගේ නමින් තමයි න්‍යාය පත්‍රයේ පළමුවැනියට මේ යෝජනාව දාන්න කිව්වේ. මම වගකීමෙන් කියන්නේ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

සභා කටයුතු කාරක සභාව කැඳවලා තීන්දුවක් ගත්තාට පස්සේ ඒ තීන්දුව නැවත කාරක සභාව කැඳවලා මිසක් වෙනස් කරන්න බැහැ. ඒ නිසා තමයි කාරක සභාව කැඳෙව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න දෙන්න බැහැ.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

වෙන හේතුවක් නිසා නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා අභියෝග කරපු හැටි. මම ඒ රැස්වීමේ හිටියා. සංවිධායකතුමාගෙනුත්, සභානායකතුමාගෙනුයි අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඇමැතිකම් හයට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා මේ මීඩියා ආවාට පස්සේ කෑ ගහනවා. පැහැදිලිව. ඔබතුමා මේ රූපවාහිනිය දැක්කාට පස්සේ, කැමරාවක් දැක්කාට පස්සේ ඔබතුමා හැමදාම කෑ ගහනවා. කරුණාකර වාඩිවෙන්න. රූපවාහිනියක් දැක්කාට පස්සේ ඔබතුමා අතපය දික් කරලා බොහොම ලස්සනට කෑ ගහනවා. ඒක ඔබතුමාගේ හැටි. මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා, දෙවැනි ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ඇත්තෙන්ම මේ කාරණයේදී වැරැද්දක් සිද්ධ වෙලා තිබෙනවා. හේතුව තමයි ගරු ආණ්ඩුකාරතුමා මේ සාකච්ඡාවට කැඳෙව්වාට පස්සේ මේ සභාවේදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, දැන් ඒ ප්‍රශ්නය ඉවරයි.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේක දිගින් දිගට යන්න පුළුවන් නේ? අනික් එක සියල්ල - මේ වාගේ කාරණයකට කල් තියනවා. මන්ත්‍රීවරයෙක් කොහේ ඉන්නවාද දන්නේ නැහැ. සාකච්ඡාවට කැඳවනකොට යම් කාලයක්, අඩුම ගණනේ පැය තුනක්, හතරක්වත් තියලා එහෙම කැඳවීමක් කරන්න ඕනෑ. මේක ඔබතුමා මේ සභාව ආරම්භයේදීම ගත්ත තීන්දුවක්. ඒක සභා කටයුතු එකට දාලා, න්‍යාය පත්‍රයට දාලා මේක සාකච්ඡා කරමුයි කියලා ගත්තු තීන්දුව ප්‍රකාශය ඔබතුමා වේලාසනින්ම කළා නම් මීට වඩා මේ කරුණු මේ තත්ත්වයට පත් වෙන්නේ නැහැයි කියලා අපි විශ්වාස කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමාගේ දෙවැනි ප්‍රශ්නය. ප්‍රවාහන ගරු ඇමැතිතුමාට.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉදිරිපත් කරනවා.

# කොලොන්නාව සමූපකාර සමිතිය : නෙස්ලේ නියෝජිතත්ත්වය

KOLONNAWA COOPERATIVE SOCIETY: NETLE REPRESENTATION

**02.**

**මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා, තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය :**

**(ප්‍ර/V(01)13/08)**

අ. කොලොන්නාව සමූපකාර සමිතියට නෙස්ලේ නියෝජිතත්වයක් හිමිව තිබූ බව පිළිගන්නේද ?

ආ. සමිතිය සතු වූ නෙස්ලේ නියෝජිතත්වය අහිමි වී ඇති බව පිළිගන්නේද?

ඇ. නෙස්ලේ බිල්පත් පියවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව ග්‍රාමීය බැංකු අංශයෙන් රුපියල් ලක්ෂ 485 ක් පාරිභෝගික අංශයට මාරු කර ඇති බව පිළිගන්නේද?

ඈ. සමිතිය සතු රුපියල් ලක්ෂ 80 ක් පමණ වටිනා නෙස්ලේ නිෂ්පාදන නෙස්ලේ ආයතනයට භාර නොදී සමිතියේ ගබඩා කර ඇති බව පිළිගන්නේද?

ඉ. ගබඩාව තුළදීම එම භාණ්ඩ කල් ඉකුත් වී පරිභෝජනයට ගත නොහැකි භාණ්ඩ තත්ත්වයට පත් වන බව පිළිගන්නේද?

ඊ. මෙම භාණ්ඩ වෙනුවෙන් දිනකට රු.15,000/- ක දඩයක් නෙස්ලේ සමාගම වෙත ගෙවිය යුතු බව පිළිගන්නේද?

උ. සමිතිය මෙම භාණ්ඩ භාර දී මෙම බැඳීම් වලින් නිදහස් නොවන්නේ මන්ද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අ. ඔව්.

ආ. නෙස්ලේ නියෝජිත ධූරය පවත්වාගෙන යාම තුළ සමිතියට සිදුවන ලාභ පාඩු පිළිබඳව අධ්‍යයනයකින් අනතුරුව නෙස්ලේ නියෝජිත ධූරයෙන් ඉවත් වී ඇත.

නෙස්ලේ නියෝජිත ධූරයේ කටයුතු කිරීම නිසා 2013 මාර්තු 31 දිනට නෙස්ලේ අංශයේ ණයගැති ශේෂය රුපියල් මිලියන 16 ක් වන අතර 2013 අප්‍රේල් 31 දිනට නෙස්ලේ අංශයෙන් අයවිය යුතු අගරු වෙක් වටිනාකම රුපියල් මිලියන 13 ක් වේ.

ඇ. පාරිභෝගික අංශයට මෙසේ මාරු කර ඇති වටිනාකම රුපියල් ලක්‍ෂ 343 කි. 2013.01.28 දිනට ග්‍රාමීය බැංකු අංශයට නැවත ගෙවිය යුතු වටිනාකම ලක්‍ෂ 141 කි.

ඈ. නැත.

ඉ. නැත.

ඊ. නැත.

උ. භාණ්ඩ ආපසු භාර දී ඇත.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, ප්‍රශ්නයක් මම අහලා තියෙනවා "අ" යන්නෙන්. අධ්‍යක්ෂ මණ්ඩලයක අනුමැතියකින් තොරව ග්‍රාමීය බැංකු අංශයෙන් ලක්ෂ 485 ක් පාරිභෝගික අංශයට මාරු කළාද කියලා. එතුමා කියනවා ලක්ෂ 485 ක නොවෙයි, ලක්ෂ 343 ක් කියලා.

අධ්‍යක්ෂ මණ්ඩලයක අනුමැතියකින් තොරව එසේ මාරු කිරීම සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා පියවර මොකක්ද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

වහාම පරීක්ෂණයක් කරනවා. අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරු හරහා පරීක්ෂණයක් කරන්න ඕනෑ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කොපමණ කාලයකින් කරනවාද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඊට පස්සේ තමයි ඊළඟ තීරණයට එන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙම නම් මම ලියලා එවන්නම්. ඔබතුමා ඒ පරීක්ෂණය කරන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

තීරණයකට ඇවිල්ලා ඒ අවශ්‍ය කටයුතු කරන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු ඇමැතිතුමාට යොමු කරනවා.

**ගරු ජගත් අංගගේ –** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, මට මේකට වාචිකව පිළිතුරු සපයන්න පුළුවන්. නමුත් මම ලිඛිතව පිළිතුරු සකස් කර ගෙන නැති නිසා සති දෙකක් කල් ඉල්ලනවා.

***ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*Hon. Chairman ordered to refer the question to the next Council sitting.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

MINISTRIE'S ANNOUCEMENTS/ MINISTER'S STATEMENTS

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ගරු සභාපතිතුමනි, විශේෂයෙන් මම නැඟී සිටියේ, 2013 ජුනි මස 08 වනදා පැවති හදිසි ආපදා අවස්ථාවේ මම හිතන්නේ ධීවරයෝ විශාල සංඛ්‍යාවකට ජීවිත පූජා කරන්න සිද්ධ වුණා. ඒ පිළිබඳව මේ සභාව යම්කිසි මට්ටමක දැනුවත් කිරීමට ප්‍රකාශයක් කරන්නයි මම බලාපොරොත්තු වන්නේ. ඒ සඳහා අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන් 2004 වර්ෂයේ පැවති සුනාමි ව්‍යසනයෙන් පස්සේ මම හිතන්නේ, ධීවර ජනතාව මුහුණ පෑ විශාලම කනගාටුදායක තත්ත්වය තමයි ගිය අටවැනිදා ඔවුන්ට මුහුණ පාන්න සිදු වුණේ. මේ සිද්ධිය නිසා විශේෂයෙන් 07 වැනිදා සිට තිබුණු කැළඹිලි සහිත කාලගුණ තත්ත්වය නිසා

[ ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා ]

බස්නාහිර පළාතේ විශේෂයෙන් මීගමුව, බේරුවල, රත්මලාන, දෙහිවල - ගල්කිස්ස, මොරටුව වැනි ප්‍රදේශවල ධීවර කර්මාන්තය සඳහා ගිය ධීවර කාර්මිකයෝ 52 කගේ ජීවිත අහිමි වුණා. ඒ එක්කම මේ වනකොටත් තවත් තුන් හතර දෙනෙක් තවම ජීවිත හොයා ගන්න බැරි තත්ත්වයෙන් අතුරුදන් වෙලා තියෙනවා. ඒ නිසා විශේෂයෙන් මේ ආපදාවට ලක් වුණේ - මම හිතන්නේ පහුගිය කාලයේ විවිධ අය විවිධ ප්‍රකාශ කළා. විශේෂයෙන් එකිනෙකාට ඇඟිල්ල දික් කළා, මේකේ වගකීම එක එක්කෙනා ගන්න ඕනෑය කියලා. නමුත් අද අපට තියෙන කාර්යභාරය ඒක නොවෙයි. අද අපට තියෙන කාර්ය භාරය තමයි මින් පස්සේවත් මේ වාගේ සිද්ධියක් ඇති නොවෙන්න අපි ගන්න ඕනෑ ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳව තමයි දැන් සිටම කතිකා කළ යුතු වන්නේ.

ඒ නිසා මම යෝජනා කරනවා සභාපතිතුමා මාර්ගයෙන් විශේෂයෙන් බස්නාහිර පළාත් සභාවක් විධියට ගරු රාජිත සේනාරත්න මැතිතුමාටත්, ඒ එක්කම රජයේ අනෙකුත් ආයතනවලටත් මේ පිළිබඳව දන්වා යවන්න කියලා. විශේෂයෙන් අපි බලාපොරොත්තු වෙනවා. බස්නාහිර පළාත් සභාවක් හැටියට විශේෂයෙන් මගේ යෝජනාවක් හැටියට සියලුම ධීවරයන් සඳහා ජීවිත කබා අනිවාර්ය කරන්න කියලා. ඒ එක්කම බස්නාහිර පළාත් සභාවෙන් සියලුම පොඩි බෝට්ටු සඳහා - ඒ ජීවිත කබා ඉතාමත් මිල අඩුයි. ඒවා නොමිලයේ ලබා දීම සඳහා යෝජනා කරනවා.

ඊළඟට මෙම සිද්ධිය සඳහා විශේෂයෙන් මුහුණ දුන්නේ එක්දින පොඩි බෝට්ටු යාත්‍රා හිමියෝ. කාලගුණය හරියටම දැනුම් දුන්නත්, මේ අය සඳහා මේ බෝට්ටු සඳහා මේ රටේ කොහේවත් දැනුම් දීමේ සන්නිවේදන ක්‍රමවේදයක් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, පොඩි බෝට්ටු සඳහා - විශේෂයෙන් පහුගිය සිද්ධියෙන් මැරුණු ඔක්කෝම ධීවරයෝ පොඩි බෝට්ටුවල ගිය අය. නැත්නම් එක්දින ධීවර රැකියාව කරපු අය. ඒ නිසා එක්දින ධීවර රැකියාව කරන අඩි 35 බෝට්ටු හෝ අඩි දහඅටහමාර, දහ හතහමාර, අඩි දහනවයහමාර බෝට්ටු සඳහා සන්නිවේදන ක්‍රමයක් සකස් කරන්න කියලා මගේ යෝජනාවක් විධියට මම යෝජනා කරනවා.

ඊළඟට විශේෂයෙන් ශ්‍රී ලංකා කාලගුණ දෙපාර්තමේන්තුව සහ ලෝකයේ අනෙකුත් කාලගුණ ආයතන විසින් ඉදිරිපත් කරන වාර්තා අධීක්ෂණය කරලා ඒ පිළිබඳව අදාළ ආයතනවලට දැනුම්දීම සඳහා - විශේෂයෙන් මෙය ධීවර අයට බලපාන නිසා ධීවර අමාත්‍යාංශය යටතේ පැය විසිහතර පුරා පරීක්ෂණ කරලා මෙය දැනුම් දිය හැකි කණ්ඩායමක් සහ ඒකකයක් පිහිටුවන්න කියන එක යෝජනා කරනවා. ඊළඟට මෙම ධීවර බෝට්ටු අනතුරට පත් වුණාම, විශේෂයෙන් පොඩි බෝට්ටු. දැනට මහ බෝට්ටුවලට නම් system එකක් තියනවා. නමුත් පොඩි බෝට්ටු අනතුරට පත් වුණාම පොඩි බෝට්ටුවේ ඒ ධීවර කාර්මිකයාට තමන් සිටින ඉසව්ව පිළිබඳව දැනුම් දෙන්න ක්‍රමවේදයක් නැහැ. එම නිසා ඒ සඳහාත් නවීණ තාක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දෙන්න කියන එකත් අපි ධීවර අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතන සඳහා යෝජනා කරනවා. ඒ එක්කම කාලගුණ දෙපාර්තමේන්තුවත් මීට වඩා සක්‍රීය කළොත් හොඳයි. විශේෂයෙන් නවීණ තාක්ෂණික උපකරණ ලබා දීලා. ඒකත් අපි යෝජනාවක් විධියට කරනවා.

ඊළඟට ධීවර ජනතාව. අපි දන්නවා. කාලගුණය මොනවා කිව්වත්, දැන් අපේ සමහර අය කියනවා, කාලගුණ දෙපාර්තමේන්තුවෙන් මේක කිව්වේ නැහැයි කියලා. කිව්වත් අපේ ධීවරයෝ නම් කාලගුණ දෙපාර්තමේන්තුවෙන් කියන දේ එහෙම පිළිපදින අය නොවෙයි. ඒ නිසා මම යෝජනාවක් විධියට කරනවා අඩුම ධීවර ජනතාව, ඒ ධීවර සංගම් හරහා කාලගුණයෙන් දෙන අනාවැකි, කාලගුණයෙන් දෙන වාර්තා අධ්‍යයනය කරන්න පුරුදු වෙන්න කියන එක. මොකද, අපි දන්නවා යුරෝපයේ ඉන්න අය හැමදාම කාලගුණය බලනවා. නමුත් ලංකාවේ අපි, කථා කරන මමවත් කාලගුණය පරීක්ෂා කර බලන්නේ නැහැ. ඒ නිසා අපේ තියෙන වැරදි හදා ගන්න ඕනෑ. ධීවර ජනතාව, ධීවර අමාත්‍යාංශය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සහ අපි සියලු දෙනා. ඒ නිසා මින් ඉදිරියට මේවා සිදු නොවෙන්න මේ වාගේ ක්‍රමවේද යෝජනා කරනවා. ඊළඟට ධීවරයාගේ රක්ෂණ ක්‍රමය, ධීවර සමිති සංගම් හරහා - මේක ආණ්ඩුවකට බලෙන් කරන්න බැහැ. ඒ නිසා මේ සමිති සංගම් හරහා විශේෂයෙන් රක්ෂණ ක්‍රමය හඳුන්වා දෙන්න කියලා යෝජනා කරනවා. ඊළඟට තියෙන සාගර විද්‍යාත්මක දත්ත එසැණින් ලබා ගන්න පුළුවන්. බෝයා දාන්න

පුළුවන් - ඒ කියන්නේ සාගර දිය වැල්. ඊළඟට ocean current කියලා කියන්නේ. මුහුදේ ඒ වෙලාවේ ක්ෂණිකව ඇතිවන වෙනස්කම් දැනගන්න පුළුවන් විධියට බෝයා දාන්න කියලා යෝජනාවක් විධියට අපි කරනවා. ඊළඟට ඒ එක්කම ඒ එන දත්ත ටික ඉක්මණින් දැනුම් දෙන්න පහසුකම් අන්තර්ජාලයට යොමු කරන්න කියලත් ඉල්ලා සිටිනවා. එතකොට අන්තර්ජාලයට යොමු වුණාම මේ රටේ ඉන්න ජනමාධ්‍ය සහ අනෙකුත් ආයතන ඒවා අරගෙන අදාළ අංශ දැනුවත් කරයි කියන එක අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට යෝජනාවක් විධියට කරනවා, කාලගුණ දෙපාර්තමේන්තුවෙන් දෙන කාලගුණ අනාවැකි විශේෂයෙන් මාධ්‍ය හරහා මීට වඩා ප්‍රමුඛත්වයක් දීලා දැනුම් දෙනවා නම්, හිරු මාධ්‍ය ආයතනය දැනුම් දුන්නා වාගේ. මම හිතනවා, ධීවර ජනතාවට ධීවර අමාත්‍යාංශයෙන් දැනුම් නොදුන්නත්, කාලගුණ දෙපාර්තමේන්තුවෙන් දැනුම් නොදුන්නත්, අනෙක් ආයතන දැනුම් නොදුන්නත් මේ ජනමාධ්‍ය හරහා යන පණිවිඩය ඉතාමත් වටිනවා. ඒ නිසා අනෙකුත් සියලුම ජනමාධ්‍ය ආයතනවලට අපි යෝජනා කරනවා, මෙය සමාජ සත්කාරයක් හැටියට සලකලා කරන්න කියන එක. ඊළඟට අපේ ධීවර අමාත්‍යාංශය හැටියට විශේෂයෙන්ම ගරු මහ ඇමතිතුමා එක්ක අපි කැබිනට් පත්‍රිකාවක් දැම්මා. අද හානි වූ ජනතාව සඳහා රජයෙන්, විශේෂයෙන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලක්ෂයක මුදලක් ලබා දෙනවා. ඊළඟට මම දැක්කා. රාජිත සේනාරත්න මැතිතුමා කියලා තිබුණා, ධීවරයන් සඳහා සහනදායක ක්‍රමයට ඒ හානි වූ අයට උදව් කරනවා කියලා. නමුත් යෝජනාවක් විධියට අපි බලාපොරොත්තු වෙනවා, බස්නාහිර පළාත තුළ බෝට්ටු එන්ජින් නැති වුණාට විශේෂයෙන්, 50% දායකත්ව සහනදායී ක්‍රමයට සියලු දෙනාට ලබා දෙන්න කියලා. අපි ඊයේ කැබිනට් පත්‍රිකාවක් අනුමත කර ගත්තා. ඒ සියලු දෙනාට ලබා දෙන්න. ඊළඟට අපි බලාපොරොත්තු වෙනවා, සුළං නිසා ධීවර ප්‍රදේශවල ජීවත් වන විශේෂයෙන් අඩු ආදායම්ලාභී - ඒ කියන්නේ පොල් අතු ගෙවල්වල, ලැලි ගෙවල්වල ඉන්න අයගේ ගෙවල්වල ඒ ලැලි ටික ගලවා ගෙන ගිහිල්ලා. පොල් අතු ගලවා ගෙන ගිහිල්ලා. ඒ අයටත් නිවාසාධාර ලබා දීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මම ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගෙන් මමත් අවස්ථාවක් අපේක්ෂා කළේ, මේ දවස්වල මැයි මාසයේ අගභාගය වන විට බස්නාහිර පළාතේ දිස්ත්‍රික් තුනේ ඩෙංගු රෝගය නිසා මිය ගිය සංඛ්‍යාව පහළොස් දෙනෙක් වෙනවා. ඒ නිසා මේ දවස්වල පවතින කඩින් කඩ වැසි තත්ත්වයන් නිසා ඩෙංගු රෝගය ඉතාමත් තදින් පැතිර යාමේ ස්වභාවයක් වර්ධනය වෙමින් තිබෙනවා. මේ නිසා අපේ සියලුම ආයතන මේ සඳහා සක්‍රීයව ක්‍රියාත්මක කරනවා වාගේම, අපේ පළාත් සභා සියලුම නියෝජිතයින්ට මම ආරාධනා කරනවා, මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව තම තමන්ගේ ප්‍රදේශවල යම් යම් ක්‍රියාමාර්ග ගැනීමේදී ප්‍රමුඛව ක්‍රියා කිරීමට කටයුතු කරන්නය කියලා. මොකද හේතුව, මම හිතන්නේ, පසුගිය දවස්වල මේ නැතිවුණු ජීවිත තක්සේරු කරන්න අපට පුළුවන්කමක් නැහැ. කාගේ ජීවිත වුණත්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු ඇමතිතුමා ඉතාම වැදගත් ප්‍රකාශයක් කරන්නේ. ඒ නිසා කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

පැහැදිලිවම මේ සභාවේ සිටින කිසි කෙනෙකුට කියන්න බැහැ, අපේ දරුවෙකුට නොවෙයි සිදු වුණේ කියලා. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, මේ අවදානම් තත්ත්වය මගහරවා ගැනීම සඳහා සියලුම පාර්ශවල සහයෝගය - අතිගරු ජනාධිපතිතුමා ජනාධිපති කාර්යසාධක බලකායක් නම් කර තිබෙනවා. ඒ එක්කම පසුගිය දවස්වල ජනාධිපති ලේකම් කාර්යාලයත් ඒ සම්බන්ධව දැඩි අවධානයෙන් කටයුතු කළා. විශේෂයෙන්ම ඒ ප්‍රදේශ භාරව ඉන්න ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්, මෙම ක්‍රියාවලියේදී ප්‍රමුඛයන් හැටියට කටයුතු කරනවා නම් මම හිතන්නේ, අපට විශාල වශයෙන් මේකට ශක්තියක්ව පවතිනවා. ඒ නිසා අපි කියන්න දන්නේ නැහැ, ඊළඟ අවස්ථාවේදී ජීවිතය අහිමි වෙන්නේ මේ කොයි පුද්ගලයාට සම්බන්ධ කෙනාගේද කියලා. ඒ නිසා මෙහි අවදානම පැතිර තිබෙන නිසා සභාවක් හැටියට බස්නාහිර සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියට, මධ්‍යම රජය විසින් ක්‍රියාත්මක කරන වැඩ සටහනට සක්‍රීයව දායකත්වය ලබා දෙන්න කියලා ඔබතුමා මගින් මේ සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී අභිනවයෙන් දිවුරුම් දුන්න චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමාට විශේෂ ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

ගරු සභාපතිතුමනි, අප රටේ පළාත් සභා ක්‍රමය ආරම්භ වී වසර විසි පහක් ගත වන මේ අවස්ථාවේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට, විශේෂයෙන්ම මේ රටේ මූලික පළාත් සභාවක් හැටියට බස්නාහිර පළාත් සභාව නියෝජනය කරන්න ලැබීම පිළිබඳව මගේ කෘතවේදී ගෞරවය මම

මේ අවස්ථාවේදී පිරිනමනවා. ඒ වාගේම එය භාග්‍යයක් කොට මම මේ අවස්ථාවේදී සලකනවා. ඒ වාගේම, මෙම සභාවට තේරී පත්වීම සඳහා මා හට වටිනා ඡන්දය ලබා දුන්න ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට මගේ ගෞරව ප්‍රණාමය මම ප්‍රථමයෙන් පිරිනමනවා. 1991 වර්ෂයේදී පළාත් පාලන මැතිවරණයට මීරිගම මැතිවරණ කොට්ඨාශයෙන් එවකට හිටපු ප්‍රධාන සංවිධායක වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ගරු අමාත්‍ය අභාවප්‍රාප්ත ගරු මහින්ද විජේරත්න මැතිතුමා එම අවස්ථාව මට ලබා දුන්නා. ඒ පළාත් පාලන මැතිවරණයේදී මීරිගම ජනතාව මීරිගම ප්‍රාදේශීය සභාවේ සභිකයෙක් හැටියට මාව ඒ ජනතා ආයතනයට පත් කරලා හැරියා. මේ වැදගත් අවස්ථාවේදී ඒ මීරිගම ජනතාව මගේ මතකයෙන් ඈත් කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම පසුගිය පළාත් සභා මැතිවරණයට ගම්පහ දිස්ත්‍රික්කයෙන් මීරිගම ආසනය තමයි මම නියෝජනය කළේ. ඒ අවස්ථාවේදී මීරිගම ජනතාව බහුතරයක් මට ඡන්ද ලබා දුන්නා. මීරිගම ජනතාව පමණක් නොවෙයි. අත්තනගල්ල, දොම්පේ වැනි මැතිවරණ කොට්ඨාශවල ජනතාවත් ඒ හා සමානවම සහයෝගයක් මට ලබා දුන්නා. ඒ පිළිබඳව ඒ ජනතාවටද මගේ කෘතවේදී ස්තුතිය මම මේ අවස්ථාවේදී පුද කරනවා.

[ ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල් ]

ගරු සභාපතිතුමනි, මෙම සභාව නියෝජනය කරපු අජිත් මාන්නප්පෙරුම ගරු මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් හැටියට දිවුරුම් දුන්නා. ඒ අනුව පුරප්පාඩුවක් මේ පළාත් සභාවේ පැවති බව ඔබ තමුන්නාන්සේලා සියලු දෙනාම දන්නවා. ඒ අවස්ථාවේදී කොතරම් ජ්‍යෙෂ්ටයෝ හිටියත් පක්ෂ ව්‍යවස්ථාව අනුව අවශ්‍ය නම් - විශේෂයෙන් පළාත් සභා ව්‍යවස්ථාව අනුව තමයි මේ සභික ධූරය සඳහා ඒ පුරප්පාඩුව පුරවන්නේ. ඒ අවස්ථාවේදී කොතරම් ජ්‍යෙෂ්ටයෝ හිටියත්, එක්සත් ජාතික පක්ෂය හැටියට අද මේ සභාවට එන්න එක්සත් ජාතික පක්ෂයේ ගරු නායකතුමා, ගරු මහ ලේකම්තුමා මගේ නම යෝජනා කරලා අද ඒ අවස්ථාව මට ලබා දීලා තියෙනවා. ඒ පිළිබඳව අප පක්ෂයේ ගරු නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, ගරු මහ ලේකම් තිස්ස අත්තනායක මැතිතුමාටත් මාගේත්, ඒ වාගේම අත්තනගල්ල ජනතාවගේත් ගෞරවය පිරිනමන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම පක්ෂය විසින් මා කෙරෙහි දක්වා ඇති විශ්වාසය ඒ ආකාරයෙන්ම කඩ නොකර ඉටු කරන්න මම මේ අවස්ථාවේදී කටයුතු කරනවාය කියන එක සිහිපත් කරනවා. පළාත් සභා ක්‍රමය හඳුන්වා දීමට පුරෝගාමී වූ හා මෙම ක්‍රමය පෝෂණය කරන්නා වූ සහ ඒ වෙනුවෙන් කැප වූ සියලු දෙනාට මේ අවස්ථාවේදී මගේ ගෞරව පූර්ව ස්තුතිය පුද කරනවා. වසර හතරකුත් දින විසි එකක් මන්ත්‍රී ධූරය නොතිබුණද, මා හැර නොගොස් මා සමඟ සිටිමින් කටයුතු කළ ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීතුමන්ලා, ආසන කළමනාකාරතුමා ඇතුළු කොට්ඨාශ ලේකම්වරුන්ට, කලාප නායකයින්ට හා මට සහාය දුන් ජනතාවට ස්තුතිවන්ත වෙනවා.

මේ සෑම කාර්යයක්ම මා හට කිරීමට හැකියාව ලැබුණේ, මා මේ ලෝකයට ජනිත කළ මගේ දෙමව්පියන් නිසා. මා හට ශක්තියක් ලබා දුන්නේ මගේ සහෝදරයා හා දෙමව්පියන්. දෙමව්පියන් ජීවත්ව නොසිටියත් අද මේ අවස්ථාවේදී මම ඒ අයව සිහිපත් කරන්නේ ඉතාමත් වේදනාවෙන්. දෙමාපියන් නොමැතිවීම තුළ මා හට ශක්තියක් ලබා දුන් මගේ සොහොයුරා, ඒ වාගේම සොහොයුරියන් තිදෙනා ඇතුළු ඥාතීන් ද මම මේ අවස්ථාවේ සිහිපත් කරන්න අවස්ථාවක් කර ගන්නවා. 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය තුළින් ඇති කරන ලද මෙම පළාත් සභා ක්‍රමය නිසා අප වැනි ප්‍රාදේශීය නියෝජිතයන්ට ඉදිරියට ඒමට හැකියාවක් ලැබී තිබෙනවා. ඒ අනුව පළාත් සභා ක්‍රමය ශක්තිමත් කිරීම අපි හැම දෙනාගේම වගකීමක් හැටියට මා දකිනවා. එය අපේ පක්ෂයේ දැක්මයි. මෙම පළාත් සභා ක්‍රමය හඳුන්වා දුන් සියලු නායකයන්ට හා ඒ වෙනුවෙන් කැපවීම් කළ සියලු දෙනාට මා මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා.

එක්සත් ජාතික පක්ෂය මෙම 13 වැනි සංශෝධනය ගෙනාවේ බලය මධ්‍යගත කිරීමට නොව, බලය විමධ්‍යගත කිරීමටය. මේ පළාත් සභා ක්‍රමය මා දකින්නේද ඉතාමත් සුභවාදීවයි. මා මේ සභාවට නැවතත් පත්වීම තුළ ගම්පහ දිස්ත්‍රික්කයේ බස්නාහිර පළාතේ ජනතාව මගෙන් යම් සේවාවක් අපේක්ෂා කරනවා. ඒ සඳහා මූල්‍ය ප්‍රතිපාදන, සම්පත් අවශ්‍යයි. ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයෙන්, ගරු ප්‍රධාන ලේකම්තුමිය ඇතුළු මූල්‍ය අංශයෙන්, ඒ වාගේම සැලසුම් අංශයෙන් මම ඉල්ලීමක් කරනවා. මොකද, මේ වසර තුළ මාස හයක් ඉදිරියට මේ පළාත් සභාව පවතිනවා. ඒ කාලසීමාව තුළදී ජනතාව වෙනුවෙන් යම් සේවාවක් කරන්න අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කියන ඉල්ලීම බස්නාහිර පළාතේ ජනතාව වෙනුවෙන් විශේෂයෙන්ම ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් ගරු අමාත්‍යතුමා ඇතුළු මූල්‍ය අංශයේ සියලු දෙනාගෙන්ම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම අද මේ සභා ගර්භයට තුන්වන වරටත් පිවිසීමේදී මා ඉතාමත් උණුසුම්ව පිළිගත් මගේ පක්ෂයේ සහෝදර මන්ත්‍රීතුමන්ලාටත්, ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලයටත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ සහෝදර ගරු මන්ත්‍රීතුමන්ලාටත්, සභාපතිතුමා, සභා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. එසේම ජනතා නියෝජිතයන් වශයෙන් අප සැමට නිති දිරි දෙන, නිවැරදි මාර්ගෝපදේශයන් සපයන සමස්ත විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍යයන්ටද මාගේ අවංක ස්තුතිය පිරිනමන ගමන් ඔවුන්ගේ සහයෝගයත් අපගේ කටයුතුවලට ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා. අවසාන වශයෙන් මට මේ ප්‍රකාශය කිරීමට අවස්ථාව සලසා දීම පිළිබඳව ගරු සභාපති සුනිල් විජේරත්න මැතිතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

ස්තුතියි. ඔබ සැමට වාසනාවන්ත යුගයක් අත්වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙමින්, මේ අවස්ථාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේත්, මගේත් සුභපැතුම් ඔබතුමාට පිරිනමනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම බස්නාහිර පළාත් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයේ සිදුවන සිද්ධීන් සම්බන්ධව මේ වෙන කොට අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාවට ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාටත් ඒ ලිපියේ පිටපතක් ඉදිරිපත් වෙලා තියෙනවා. මේ ලිපිය මා වෙතත් ලබා දීලා මේ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡාවක් කරපු නිසා තමයි අද ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරන්න විශේෂ ප්‍රකාශයක් හැටියට මෙය කරන්න බලාපොරොත්තු වුණේ.

අපි දන්නවා. අධික ලෙස දුම් පිටවෙන වාහන මාර්ගයේ ගමන් කිරීම නිසාම මේ සමාජ පරිසරයට විශාල හානියක් සිදු වෙනවා. ඒ වාහන පාරේ ගමන් කරන විට එයින් පිටවෙන විශාල දුමාරය නිසා ඒවා ආඝ්‍රාණය කරන ජනතාව විශාල වශයෙන් රෝග පීඩාවලට පත් වෙනවා. මේ පත්වෙන කාරණය නිසාම මේ රටේ සෞඛ්‍ය වෙනුවෙන් රජයට විශාල වියදමක් දරන්න සිද්ධ වෙනවා. ඒ නිසාම එවකට රජය ගත් තීන්දුවක් මත ශ්‍රේෂ්ඨාධිකරණයට පවරපු යම් නඩු තීන්දුවක් මත හැම වාහනයක්ම දුම් පිටවීම පිළිබඳව තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගන්නා ඕනෑ. ඒ අනුව තමයි අදාළ වාර්ෂික බලපත්‍රය ලබා ගත යුත්තේ. එය සම්පූර්ණ වුණාම කියන නීතිය මේ වෙන කොට ක්‍රියාත්මක වෙනවා. නමුත් අපි දන්නවා, මේ ශ්‍රේෂ්ඨාධිකරණය ගත්ත තීන්දුව අනුව පළාත් ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් වන වාහන බලපත්‍ර ගැනීමේදී දුම් පිටවෙන මේ සහතිකය ව්‍යාජ ලෙස නිලධාරීන් කිහිප දෙනෙක් එකට එකතු වෙලා එයින් මුදල් ගරා ගැනීමක් සිදු වන නිසා එක පැත්තකින් රටේ කැබිනට් මණ්ඩලය, ශ්‍රේෂ්ඨාධිකරණය ගත්ත තීන්දුව හැල්ලුවකට ලක් කරනවා. අනෙක් පැත්තෙන් පළාත් සභාවට ලැබිය යුතු විශාල මුදල් ප්‍රමාණයක් ඔවුන් තමන්ගේ සාක්කුවට දා ගෙන ඒවා තමන්ගේ පුද්ගලික සුඛ විහරණය සඳහා පාවිච්චි කරනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ අයථා මුදල් ඉපැයීම නිසාම මම හිතන්නේ, මේ පළාත් සභාවට ලැබිය යුතු, ලැබෙන්න තියෙන විශාල ආදායමක් අහිමි වෙනවාය කිය එකත් අපි මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව අදාළ අමාත්‍යතුමාගේ අවධානයට යොමු කරලා මේ රටේ ජනයා වෙනුවෙන් මම හිතන්නේ කැබිනට් මණ්ඩලය, ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දීලා තියෙන තීන්දුව උල්ලංඝණය කරමින් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් කාර්යාලයේ මෙවැනි අක්‍රමිකතාවයක් සිද්ධ වෙනවාය කියන එක දැනුම් දීලා තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව ගරු අමාත්‍යතුමාට පුද්ගලිකව සොයලා බලලා මේ අදාළ නිලධාරීන් මේ කාරණයට සම්බන්ධද, හවුල් ද, කොපමණ පිරිසක් මේ වෙන කොට මහජන මුදල් නාස්ති කරලා තමන්ගේ සාක්කුවට දාගෙන තියෙනවාද කියලා පරීක්ෂණයක් කරන්න. මේ පරීක්ෂණය සඳහා මේ වෙන කොට අල්ලස් හෝ දූෂණ කොමිෂන් සභාවටත් මෙකී කාරණා ඉදිරිපත් වෙලා තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව රටේ ජාතික මුදල්, මහජන මුදල් කාබාසිනියා කරන නිලධාරීන් පිළිබඳව සොයා බලන්නය කියන එක තමයි මා මේ අවස්ථාවේදී ඔබතුමා හරහා ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරන්නේ. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ලිපිය සභාගත කරනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ. මේක මට පුද්ගලිකව දීපු එකක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී මෙම සභාව උදෑසන තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.20 ට අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියගේ ප්‍රධානත්වයෙන් යළිත් රැස්විය.***

*Accordingly the Sitting, Suspended and. resumed at 11.20 a.m with Hon. Ashoka Lankathilaka in the Chair.*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ සිරිකමල් ද සිල්වා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ විශේෂ ප්‍රකාශය කරන්නේ විශේෂයෙන්ම මේ රටේ පළාත් පාලන මැතිවරණ ඉතිහාසයේ පැරණි කොට්ඨාශ ක්‍රමය යටතේ අපි දන්නවා මොනතරම් සේවාවක් කරපු පළාත් පාලන මන්ත්‍රීවරු මේ රටේ ගම් සභා, සුළු නගර සභාවල හිටියාද කියලා. නමුත් 1988

සමානුපාතික ඡන්ද ක්‍රමය මේ රටට හඳුන්වලා දුන්නාට පස්සේ මේ පළාත් පාලන ආයතනවලටත් සමානුපාතික ඡන්ද ක්‍රමය, මනාප ඡන්ද ක්‍රමය ඇවිල්ලා ඒ පළාත් පාලන මැතිවරණත් ඒ ආකාරයට තමයි පැවැත් වූයේ. දැන් මේ වන කොට රජය විසින් නැවත වතාවක් පළාත් පාලන මැතිවරණ කොට්ඨාශ ක්‍රමයට සහ සමානුපාතික ක්‍රමයට කරන්න කියලා යෝජනා කරලා, ස්ථිර කරලා මේ අවස්ථාව වන කොට පාර්ලිමේන්තුවේ ඒ පනත සම්මත කරලා තියෙනවා. නමුත් දැන් මෙතැන පොඩි ප්‍රශ්නයක් තියෙනවා. මේ වන කොට මේ බස්නාහිර පළාත් සභාව ඇතුළු ලංකාවේ පළාත් පාලන ආයතනවල විවිධ හේතූන් නිසා පුරප්පාඩු වුණු මන්ත්‍රී ධූර තියෙනවා. උදාහරණයක් හැටියට වත්තල ප්‍රාදේශීය සභාවේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ජ්‍යෝෂ්ඨ මන්ත්‍රීවරයෙක් පසුගිය මාසයේ මිය ගියා. ඔහුගේ පුරප්පාඩුව පුරවාගන්නත් විධියක් නැතුව ඉන්නවා. මොකද, රජය මේ අනුගමනය කරපු ක්‍රියා පිළිවෙත නිසා කොහොමද මේ පුරප්පාඩු වුණු මන්ත්‍රී ධූරය පුරවන්නේ. දැන් පාර්ලිමේන්තුවේ පනත සම්මත කරලා අවසානයි. නමුත් මේ පැරණි මැතිවරණ ක්‍රමය නිසා මේක කරන්න විධියක් නැතුව ඉන්නවා. මේ පිළිබඳව අවස්ථා කිහිපයකදී මේ සභාවේත් විවිධ මන්ත්‍රීවරු කරුණු පැහැදිලි කිරීමක් කළා. නමුත් මධ්‍යම රජය මේක තේරුම් ගන්න ආකාරයක් පේන්න නැහැ. පාර්ලිමේන්තුවට අද වන තුරු වත් මේ පිළිබඳව අවශ්‍ය කරන විධිවිධාන ඉදිරිපත් කරලා නැහැ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

පත් කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පත් කරන ක්‍රමවේදයක් තවම නැහැ. මේ මොහොත වනතුරුත් තවම නැහැ. ඒ නිසා මම ඉල්ලීමක් කරන්නේ ඔබතුමිය මාර්ගයෙන් - විශේෂයෙන්ම අපි පළාත් පාලන මැතිවරණ කොට්ඨාශ ක්‍රමයට ගේන්න ගෙනාපු සංශෝධන පනතට කැමතියි. නමුත් දැන් පවතින නගර සභාවල, ප්‍රාදේශීය සභාවල පුරප්පාඩු ඇති වුණාම නැවත වතාවක් ඒ පුරප්පාඩු පුරවන්නේ කොහොමද කියන එක පිළිබඳව විශාල අඩුපාඩුවක් එතැන තිබුණා. එතැන හිඩැසක් තිබුණා. ඒ හිඩැස හරිගස්සලා ජනතාවට අවශ්‍ය කරන ජනතා නියෝජනය සහ ඒ පළාත් පාලන ආයතන ශක්තිමත් විධියට ඒ නියෝජිතවරුන්ගෙන් පරිපූර්ණ කරන්න කියන ඉල්ලීම ඔබතුමිය මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද කවුරුත් දන්නවා, ආන්දෝලනාත්මක සිද්ධියක් තමයි වෙලා තියෙන්නේ. ඊයේ පෙරේදා වයඹ පළාත් සභාවේ අධ්‍යාපන කොට්ඨාශයේ නවගත්තේගම නවෝදා පාසලට පොල්ලක් රැගෙන පියෙක් කියලා පළාත් සභා මන්ත්‍රීවරයෙක් ඇවිල්ලා ඒ කරපු දේ අපි පිළිකුලෙන් හෙලා දකිනවා වාගේම අපි කවුරුත් දන්නවා, ඒ සිද්ධිය තුළ පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ කීර්ති නාමයට කැළලක් වුණු බව. ඒ වාගේම එම පාසලේ විනය කටයුතු භාර ආචාර්යතුමියව, ශිෂ්‍ය ශිෂ්‍යාවන්, ඒ වාගේම දෙමව්පියන්, ගුරුවරු ගුරුවරියන් ඉදිරියේ දණ ගැස්වීම පිළිකුලෙන් අපි විපක්ෂයක් වශයෙන් හෙළා දකිනවා. මේක පළාත් සභා ක්ෂේත්‍රයටම කරපු අගෞරවයක්. ඒ වාගේම අද අපි පාසලකට ගියාත්ම අපහසුතාවයකට පත් වෙනවා. ඊයේ දවසේ මම උත්සවයකට යනකොට මට ගුරුවරියක් ප්‍රකාශ කළේ ආ.. පළාත් සභා මන්ත්‍රී කෙනෙක් එනවා. හැබැයි, එක්සත් ජාතික පක්ෂයේ කිව්වාම හිනා ගියා. ඒ කියන්නේ ඒ තත්ත්වයට වැටිලා. ආනන්ද සරත් කුමාර ඒ ළාත් සභා මන්ත්‍රීතුමා ඒ කරපු දේ නිසා අද පළාත් සභා මන්ත්‍රීවරුන් ඒ තත්ත්වයට වැටුණු බව අපි ප්‍රකාශ කරන්න ඕනෑ. අපි දන්නවා, වර්තමානයේ කාන්තාවන්, තරුණියන්, දැරියන් හිංසාවන්ට, පීඩාවන්ට, අතවරයන්ට ලක්වන එක වැඩි වශයෙන් සිදු වන දෙයක් කියලා. ප්‍රාදේශීය සභා, නගර සභා. දැන් පළාත් සභාත් එකතු වෙලා තියෙනවා. අපි දකිනවා. රිමාන්ඩ් භාරයේ විශාල මහජන නියෝජිත පිරිසක් ඉන්නවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ආණ්ඩු පක්ෂයේ. මාවනැල්ලේ එක නීතියක්. ඇඹිලිපිටියට තව නීතියක්. තංගල්ලට තව නීතියක්. අද තව නීතියක්. එවැනි දූෂිත මන්ත්‍රීවරු අපි තරයේ හෙළා දකිනවා. අපි සන්තෝෂ වෙනවා, කාන්තාවන් සම්බන්ධව කථා කරන කොට නිර්භීත මන්ත්‍රීවරියක් මේ මූලාසනයේ සිටීම පිළිබඳව. මන්ත්‍රීතුමියත් මම හිතන්නේ ඒක හෙළා දකිනවා. ඒක තමයි ඇත්ත දේ. (බාධා කිරීම්) අද ඔබතුමන්ලාගේ රජය අධ්‍යාපනයත් දණ ගැස්වූවා. මම ඉල්ලීමක් කරනවා, මේ මන්ත්‍රීතුමාවත් මේ විධියටම දණ ගස්වලා - ජනාධිපතිතුමා දුරකථනයෙන් කථා කරලා සීනි බෝල දීම නොවෙයි. දණ ගස්වලා ආදර්ශයක් ඇති කරන්න කියන එකයි මම මේ වෙලාවේ ඉල්ලීමක් කරන්නේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විපක්ෂයේ සංවිධායකතුමාගේ ප්‍රකාශයෙන් පසුව මගේ ප්‍රකාශය කරන්න ලැබීමත් එක්තරා පුදුම සහගත කාරණයක්. මම ප්‍රකාශ කරන්නේ ඇත්තටම මේ දිනවල දේශපාලන ක්ෂේත්‍රයේ දේශපාලනයේ නියැලෙන මහජන නියෝජිතයින් සම්බන්ධව විශාල වශයෙන් චෝදනා එල්ල වෙනවා. විපක්ෂය ආණ්ඩු පක්ෂයට ඇඟිල්ල දික් කරනවා. ආණ්ඩු පක්ෂය විපක්ෂයට ඇඟිල්ල දික් කරනවා. කොහොම නමුත් මේ දේශපාලන ක්ෂේත්‍රය ගත්තාම දේශපාලනය තුළ අනෙක් ක්ෂේත්‍රයන් වාගේම - හැබැයි, දේශපාලනය තුළ ඊට වඩා වගකීමක් තියෙනවා. මහජන ඡන්දයෙන් තේරී පත් වන නියෝජිතයන් හැටියට අප කාටත් වගකීමක් තියෙනවා. ඒ මහජනතාව දෙන වගකීම හරියාකාරව

ඉටු කිරීම සම්බන්ධව. ඒ නිසා සියලු දේශපාලන පක්ෂවල විවිධ චෝදනා මත විවිධ අය සම්බන්ධව යම් යම් ආකාරයේ පැමිණිලි ලැබිලා අධිකරණයට ගිහිල්ලා - දැන් විපක්ෂයේ සංවිධායකතුමා කිව්වා මාවනැල්ලේ සභාපතිවරයා පිළිබඳව. මම ඒ සිද්ධිය පිළිබඳව සොයා බැලුවා. ඇත්ත. මිනී මැරුම් චෝදනාවකට ඔහුව එල්ලුම්ගහට නියම කරලා තියෙනවා. හැබැයි, ඒ මිනී මැරුම් චෝදනාව තිබෙද්දි තමයි ඔහු ඡන්දයට තරග කරන්නේ. මහජනතාව වැඩිම ඡන්දයෙන් ඔහුව තමයි පත් කරලා තියෙන්නේ. දැන් මේක තමයි අපට තියෙන ප්‍රශ්නය. මහජනතාව වැඩිම ඡන්දයෙන් තමයි ඔහුව පත් කරලා තියෙන්නේ. මිනී මැරුම් චෝදනාව තිබියදී. ඇත්තටම කුමන දේශපාලන පක්ෂයක් වුවත් ප්‍රශ්නයක්. දැන් මම දැක්කා සියලු දේශපාලන පක්ෂවල - කාටවත් ශුද්ධ වෙන්න බැහැ. ඒ නිසා මේකේ අපි කතිකාවතක් ඇති කරගත යුතුයි මේ සම්බන්ධව දේශපාලනඥයෝ හැටියට අපේ වගකීම් අපේ වගවීම් සම්බන්ධව. මම හිතන්නේ, මීටත් වඩා මහජන නියෝජිතයින් අවධානය යොමු කළ යුතු කාලය එළැඹ තියෙනවාය කියන කාරණය තමයි මට හිතෙන්නේ.

මම සති දෙකකට කලින් මව්බිම පත්තරේ කියවන කොට මට සතුටක් ඇති වුණා. එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී රවි කරුණානායක මැතිතුමා පිළිබඳව. මගේ මොන තරම් විවේචන තිබුණත් එතුමා කරපු ප්‍රකාශයක් මව්බිම පත්තරේ 2013 ජූනි 07 වැනි සිකුරාදා පළ වෙලා තිබුණා. මම මේක සභාගත කරනවා.[1] මගේ ප්‍රකාශයෙන් පසුව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නියෝජ්‍ය නායක

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නියෝජ්‍ය නායක නේද? එතුමා කාරණයක් පැහැදිලි කරනවා. ඇත්තටම මම ඔබතුමිය මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය මේ සම්බන්ධයෙන් යොමු කරනවා. එතුමා පැහැදිලිව කියනවා, කොළඹ මහ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීන් අල්ලස් ගන්නවා. ජූනි මස 07 වැනිදා මෙය පළ වෙන්නේ. එතුමා මේ ප්‍රකාශය කරන්නේ 05 වැනිදා. හැබැයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමා කියනවා, ඔප්පු කරන්න දිවුරුම් පෙත්සම් මා ළඟ තියෙනවා. කියලා එතුමාගේ ප්‍රකාශයේ පැහැදිලිව කියනවා.

*"කොළඹ මහ නගර සභාවේ එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් නාගරික මන්ත්‍රීවරු අල්ලස් ගන්නා බවට චෝදනා කරන කොළඹ දිස්ත්‍රික් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රී රවි කරුණානායක මහතා එලෙස අල්ලස් ගත් මන්ත්‍රීවරුන්ගේ විස්තර හා ඔවුන්ට අල්ලස් දුන් බව පිළිගනිමින් ඒ ඒ පුද්ගලයන් විසින් දෙන ලද දිවුරුම් පෙත්සම් ද තමා සන්තකයේ තිබෙන බව ප්‍රකාශ කර තිබේ."*

මේ එතුමාගේ ප්‍රකාශය. මම දිගින් දිගටම අද වෙන කල් මේ සම්බන්ධව මව්බිම පුවත්පත - මා දිනපතා සියලු පුවත්පත් කියවනවා මව්බිම පුවත්පත මම දිගටම කියවනවා. මම ඒකෙදි දිගන් දිගටම බැලුවා, මේ ප්‍රකාශය සම්බන්ධව වැරදි සහගත යැයි කියලා රවි කරුණානායක මැතිතුමා නිවැරදි කිරීමක් කරයි ද කියලා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා - මේ ප්‍රකාශය කරද්දී විපක්ෂ නායකතුමා ඉඳලා තියෙනවා. කොළඹ නගරාධිපතිතුමා ඉඳලා තියෙනවා. එතකොට මේ සම්බන්ධව කවුරු හෝ නිවැරදි කිරීමක් මේක මෙසේ නොවූවාය කියලා මේ පුවත්පත හරහා කරයි කියලා මම බලාපොරොත්තු වුණා. එහෙම දෙයක් වුණේ නැහැ. ඒ කියන්නේ, මේ ප්‍රකාශය රවි කරුණානායක මැතිතුමා පැහැදිලිව කර තිබෙන ප්‍රකාශයක්. ඒ නිසා පළාත් සභා බලතල පිළිබඳව මහා පුළුල් සංවාදයක් පවතින සමයක මම පළාත් සභාවේ බලය කොයිතරම් වටිනවාද කියන කාරණය, පළාත් සභා බලය බෙදා හැරීම සම්බන්ධව බල පංගුකාරිත්වය පැහැදිලිව මේ රටේ ජනතාවට තිබිය යුතු උරුමයක් කියන එක පිළිගන්නා පුද්ගලයෙක් හැටියට ඒ පළාත් සභාව සතු බලය නිවැරදිව භාවිතා කිරීම සඳහා මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් එතුමාගේ වගකීම ඉෂ්ට කරන හැටියට මා ඉල්ලා සිටිනවා. මොකද, පළාත් පාලන විෂය භාර මේ බස්නාහිර පළාතේ අමාත්‍යවරයා ඔබතුමා. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මගින් මම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් ආරම්භ කරන්නට ඕනෑ. රවි කරුණානායක මැතිතුමාට ලිඛිත ඉල්ලීමක් කරලා එතුමා ළඟ තියෙනවයි කියන දිවුරුම් ප්‍රකාශ කරුණාකරලා අරගෙන, පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යවරයා හැටියට මෙතුමාට බරපතළ චෝදනාවක්. කොළඹ නගර සභාවේ මන්ත්‍රීවරු සම්බන්ධව. විපක්ෂ නායකතුමා සිරිකොතට ගල් ගැහුවා කියලා ඊයේ මන්ත්‍රීවරු දහනවයක්ද කොහේද අස් කළා. දැන් එතුමාට පුළුවන් මේ සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගන්න. අපි බලාපොරොත්තු වෙනවා, එක්සත් ජාතික පක්ෂයේ පිරිසිදු බව පෙන්වන්න එක්සත් ජාතික පක්ෂය ඒ සම්බන්ධව කටයුතු කරයි කියලා. ඊට අමතරව, ඔබතුමිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා. කරුණාකරලා පළාත් පාලන පනත යටතේ ඔබතුමාට පැවරි ඇති බලතල පාවිච්චි කරමින්, මේ සිද්ධිය සම්බන්ධව පරීක්ෂණයක් පවත්වන ගමන් මේ සිද්ධිය පිළිබඳව වහාම අල්ලස් දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කරලා, අල්ලස් දෙපාර්තමේන්තුව මගින් මේ අල්ලස් ලබා ගෙන තියෙන නාගරික මන්ත්‍රීවරුන් කවුරුන්ද කියන කාරණය -

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

---

[1] කථාව අවසානයේ පළ කර ඇත.

කොලොන්නාවේ උප නගරාධිපතිත් කියනවා. නගරාධිපති ගැන කියන්නේත්. ඒකත් කරන්න කියලා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මගින් ඔබතුමාට කියන්නට ඕනෑ, කොලොන්නාවේ නොවෙයි ඕනෑම තැනක නීති විරෝධී කටයුත්තක් කරනවා නම් ඒ සම්බන්ධව විරුද්ධව කටයුතු කිරීම මහජන නියෝජිතයන් වන අපේ වගකීමක්. ඒ නිසා ඒ වෙනුවෙන් අපි ඕනෑම වෙලාවක පෙනී සිටිනවා. නීතිගරුක ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම සඳහා අපි හැමදාම පෙනී සිටියේ. ඒ නිසා පක්ෂ භේදයක් නොවෙයි. මම මුලින්ම කිව්වා. මේකේ පක්ෂ භේදයක් නොවෙයි.

**ගරු ඒ.එම්. යුසුෆ්**
Hon. A M Yoosuf

මොරටුව–

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒක තමයි. අධිකරණයට ඉදිරිපත් කරලා ක්‍රියාමාර්ග අරගෙන තියෙනවා. මම ඔබතුමිය මගින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අල්ලස් දෙපාර්තමේන්තුවට පැමිණිලි කරලා මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වන්න කියලා. කොළඹ නගරයේ ජනතාව වෙනුවෙන් ඡන්දය ලබා ගත්ත මහජන

[ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

නියෝජිතයෝ අල්ලස් ලබාගත්තයි කියලා කවුරුවත් නොවෙයි, එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකවරයා පැමිණිලි කරන්නේ. ඒ නිසා මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පවත්වන්නය කියන කාරණය මතක් කරමින් මව්බිම පුවත්පත නිවැරදිව වාර්තා කිරීම සම්බන්ධව ඒ මාධ්‍ය ආයතනයට මගේ ස්තුතිය පළකරමින් මා නිහඬ වෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මුලින්ම උප සභාපතිවරයා, සභාපතිරවයාට කරපු චෝදනාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමා එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක කියලා සඳහන් කළා. එහෙම එකක් නැහැ. ඒක එතුමාට නිවැරදි කරන්න කියලා කියනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මොකක්ද තනතුර –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පාර්ලිමේන්තු මන්ත්‍රී. කොළඹ දිස්ත්‍රික් නායක.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒ කියපු කාරණාව මම නිවැරදි කර ගන්නවා. එක්සත් ජාතික පක්ෂයේ කොළඹ දිස්ත්‍රික් නායක රවි කරුණානායක පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය සම්බන්ධව.

***[සභාගත කළ ලේඛනය]**
*[Document Tabled]*


මව්බිම
බටහිර
කොළඹ ගම්පහ කළුතර
2013 ජුනි 07 සිකු...
කොළඹ නගර සභාවේ
එ.ජා.ප. මන්ත්‍රීන් අල්ලස් ගන්නවා
- ඔප්පු කරන්න දිවුරුම් පෙත්සම් මා ළඟ තියෙනවා
- කොමසාරිස් හා නිලධාරීන් නටන්නේ ආරක්ෂක ලේකම්ගේ පදයටයි
- කොමසාරිස්වරිය පුරපති තඹදොයිතුවකට ගණන් ගන්නේ නෑ

එ.ජා.ප. මන්ත්‍රී රවි කරුණානායක හෙළි කරයි

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

බොහොම ස්තුතියි. දැන් ගරු සභා කටයුතු අමාත්‍යතුමාට අවස්ථාව සභාවේ කටයුතු සම්බන්ධ යෝජනාව ඉදිරිපත් කරන්න.

# පළාත් සභාවේ කටයුතු
# PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ජගත් අංගගේ –** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතු යැයි"* මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : කළුතර ප්‍රාදේශීය සභාව

BY-LAW RELATED TO PARKING OF THREEWHEELERS: KALUTARA PRADESHIYA SABHA

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ කළුතර ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද කළුතර ප්‍රාදේශීය සභාවේ - "ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1725/16 දරන හා 2011.09.29 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එහි අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විනාඩියක් දෙන්න. ප්‍රඥප්තිය සම්මත කරලා ඉදිරිපත් කරනවා. මේවායේ පාලනය පිළිබඳව ඔබතුමාගේ දැඩි අවධානය යොමු කරන්න ඕනෑ කියලයි මම ඉල්ලීමක් කරන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක විශේෂ කාරක සභාවට යොමු කරනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

කළුතර ප්‍රාදේශීය සභාව නාගොඩ රෝහලට යාබදව පෞද්ගලික ඉඩමක් බලෙන් වාගේ තබාගෙන ඒ ස්ථානයේ මෙය පවත්වාගෙන යනවා. ඒවායේ ගණුදෙනු සහ නීත්‍යානුකූලතාවය පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඒ වාගේ අනෙක් තැන්වලත් ඇති. මේවා දෙනිකව ප්‍රාදේශීය සභාවට මුදල් ලැබෙන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මේ පිළිබඳව සාකච්ඡා කරන කොට ඔය කරුණු ඉදිරිපත් කළා නම් තමයි හොඳ. ඒ නිසා විස්තරාත්මක සාකච්ඡා කිරීම සඳහා විශේෂ කාරක සභාවක් ලෙස සලකා ප්‍රඥප්ති හා නීති පිළිබඳ කාරක සභාවට යොමු කරනවා. අදාළ ලිපි ලේඛන සියල්ලම 2013.06.04 වන දින සභාවේ න්‍යාය පත්‍රය සමග සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත ලැබෙන්නට සලස්වා තිබෙනවා.

***ප්‍රශ්නය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***

*It was ordered to refer the question to the Committee on Statutes and Laws.*

# නගර සභා බල ප්‍රදේශවල වාහන නතර කර තැබීම

PARKING OF VAHICLES IN URBAN CONCIL AREAS OF AUTHORITY

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,*

*නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම ඒ ස්ථාන වල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන*

*උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***

*It was ordered to refer the question to the Committee on Statutes and Laws.*

## ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම

PARKING OF VAHICLES IN PRADESHIYA SABHA AREAS OF AUTHORITY

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ දෙවන වගන්තියෙහි පළමුවන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා විසින් සාදනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1725/16 දරන 2011 සැප්තැම්බර් 29 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද,*

*ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම ඒ ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*
[ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

*1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේම 3 වන උප වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***

*It was ordered to refer the question to the Committee on Statutes and Laws.*

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : පානදුර නගර සභාව

BY-LAW RELATED TO PARKING OF THREEWHEELERS: PANADURA URBAN COUNCIL

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"255 අධිකාරිය වන නගර සභා ආඥා වනතේ 157 (14 අ) වන උප වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 153 වන වගන්තිය යටතේ පානදුර නගර සභාව විසින් සාදන ලද පානදුර නගර සභාවේ - "ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු වූ 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වගන්තිය යටතේ, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1783/39 දරන හා 2012 නොවැම්බර් මස 09 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුන අතර,*

*එහි අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කර සිටිමින්ම එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 156 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***

*It was ordered to refer the question to the Committee on Statutes and Laws.*

## පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය : පළමුවන වර කියැවීම

PROVINCIAL ROAD DEVELOPMENT AUTHORITY (AMENDMENT) STATUTE : FIRST READING

**ගරු නිමල් ලාන්සා – අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *"2013 අංක ..... දරන බස්නාහිර පළාතේ පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (සංශෝධන) ප්‍රඥප්තිය"* පළමුවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**** [පූර්විකාව]***
*[Preamble]*

**හේමන්ත සමරකෝන් මහතා**
Mr. Hemantha Samarakoon

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව වූ,

*"1989 අංක 04 දරන බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි"*

යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තූතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

සභා රීති ප්‍රකාරව ප්‍රඥප්තියේ පළමුවන වර කියැවීමේ වැඩ කටයුතු දැන් නිමා වුණා. විස්තරාත්මකව සලකා බැලීම සඳහා එම ප්‍රඥප්ති කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනවා.

***ප්‍රශ්නය ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***
*It was ordered to refer the question to the Committee on Statutes and Laws.*

## දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය : දෙවනවර කියැවීම
INDIGENOUS MEDICINE STATUTE : SECOND READING

**ගරු ජගත් අංගගේ – අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"බස්නාහිර පළාතේ 2012 අංක ....... දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය"*[2] දෙවනවර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ප්‍රඥප්තිය දෙවනවර කියැවීමේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා *පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා ඇත.*

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

## පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු ජගත් අංගගේ – අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 2013.06.04 වන දින පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී මෙම ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳ සලකා බැලීමෙන් අනතුරුව ඉදිරිපත් වූ සංශෝධන ඇතුළත් කාරක සභා වාර්තාව සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙත ඉදිරිපත් කර තිබෙනවා. එම සංශෝධනවලට යටත්ව මෙම ප්‍රඥප්ති කෙටුම්පත සභා සම්මත කිරීමට මා යෝජනා කරනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මේ සඳහා සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted.*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

---
[2] කෙටුම්පත පිළිබඳ විවාදය අවසානයේ පළ කර ඇත.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මෙම අවස්ථාවේදී පූර්ණ කාරක සභාව පළාත් භාව බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පූ.භා. 11.44 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 11.44 a.m. the Provincial Council resolved itself in to a committee of the whole Council.*

**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඒ අනුව බස්නාහිර පළාතේ 2013 අංක ....... දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය දෙවන වර කියැවීමේදී සංශෝධන සහිතව සභා සම්මත වූ බව පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය ලෙස ප්‍රකාශ කරනවා.

# දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය : තෙවනවර කියැවීම
INDIGENOUS MEDICINE STATUTE : THIRD READING

**ගරු ජගත් අංගගේ** – අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"බස්නාහිර පළාතේ 2013 අංක ...... දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය"* තෙවනවර කියැවීම සඳහා සභාවට ඉදිරිපත් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended question having put and adopted.*
***දේශීය වෛද්‍ය ප්‍රඥප්ති කෙටුම්පත :***

*(ඈ) අදාළ ආයතනය පිහිටි ප්‍රදේශයේ පවත්වා ගෙන යනු ලබන ස්වේච්ඡා සංවිධානවල නියෝජිතයන්,*

*(ඇ) ප්‍රදේශයේ සිටින ලියාපදිංචි දේශීය වෛද්‍යවරුන්,*

*(ඉ) පූජ්‍ය පක්ෂ නියෝජනය කරන නියෝජිතයන්,*

*(ඊ) රෝහල් සේවක මණ්ඩලයේ නියෝජිතයන්,*

*(උ) ආයතනයේ සංවර්ධනය සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාදිය හැකි වෙනත් පුද්ගලයන්*

*ප්‍රඥප්ති කෙටුම්පතේ 29(3) උපවගන්තිය පහත පරිදි සංශෝධනය කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදි.*

*"(3) ඉහත ඇ,ඈ, ඉ, ඊ, උ ඡේද වල සඳහන් නියෝජිතයන් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව පත් කළ යුතු අතර ඒ ඒ ඡේද ප්‍රකාර පත් කළ යුතු නියෝජිතයන් සංඛ්‍යාව ආයතනයේ වර්ගීකරණයට අනුව අමාත්‍යවරයා විසින් රීති මඟින් තීරණය කළ යුත්තේය."*

*ප්‍රඥප්ති කෙටුම්පතේ 29(4) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.*

*"(4) රෝහල් කමිටුව විසින් නිර්දේශ කරනු ලබන කමිටු සාමාජිකයන් තිදෙනෙකු අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තැනැත්තෙකු මෙම කමිටුවේ සභාපති වන අතර ආයතනය භාර වෛද්‍ය නිලධාරී නිල බලයෙන් මෙම කමිටුවේ ලේකම් වන්නේය."*

*ප්‍රඥප්ති කෙටුම්පතේ 30 වගන්තියේ "28 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ රෝහල් " යන්න " 29 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ රෝහල් " ලෙස සංශෝධනය කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදි.*

*ප්‍රඥප්ති කෙටුම්පතේ 31(3)උප වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදි.*

*"(3) ස්වකීය කාර්ය ඉටු කිරීමේදී රෝහල් සංවර්ධන කමිටු සාමාජිකත් තම කමිටු සාමාජිකත්වය මත රෝහල් කටයුතු සම්බන්ධයෙන් අයුතු බලපෑම් සිදු කිරීම නොකළ යුත්තේය."*

*ප්‍රඥප්ති කෙටුම්පතේ 32(1) උපවගන්තියේ "ඒ" ඡේදය "ඔ" ලෙස නම් කර "ඒ" ඡේදය පහත පරිදි අළුතින් ඇතුළත් කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.*

***2013.06.04 පැවැති ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාවේ සඳහන් සංශෝධනයන්.***

*ප්‍රඥප්ති කෙටුම්පතේ ප්‍රඥප්ති නාමයේ "2012" යන්න "2013" විය යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.*

*29(2) උප වගන්තියේ ඇ, ඈ, ඉ, ඊ, උ යන ඡේද පිළිවෙලින් පහත පරිදි වෙනස් කළ යුතු බව යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.*

[3]. 2013.06.04 දින ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාව බලන්න.

*"(ඒ) රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම සහ සංයුතිය තීරණය කිරීම ;"*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## වෘත්තීය නිපුණතාවය ලබා දෙමින් උසස්වීම් සඳහා ඉඩ ප්‍රස්ථා පුළුල් කරමින් ගුරුවරුන්ට විශේෂ පුහුණුවක් ලබා දෙමින් ශක්තිමත් ගුරු පරපුරක් බිහි කිරීම
CREATING A STRONG TEACHER GENERATION BY PROVIDING PROFESSIONAL SKILLS, EXPANDING OPPORTUNITIES FOR PROMOTIONS AND PROVIDING A SPECIAL TRAINING TO TEACHERS

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යෝජනාවේ සංශෝධනයක් තිබෙනවා. සංශෝධන සහිතව මම මෙම යෝජනාව ඉදිරිපත් කරනවා.

"*නැණ ගුණ වැඩුම මහින්ද චින්තන ප්‍රතිපත්තිය අනුව යමින්, 2005 වසරේ සිට උපාධිධාරීන් සුවිශාල සංඛ්‍යාවකට බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ ගුරු පත්වීම් ලබා දීම කාගේත් ප්‍රශංසාවට ලක්වන්නකි.*

*විවිධ විෂය ක්ෂේත්‍රයන්ගෙන් උපාධිලත් උපාධිධාරීන් වන මෙම ගුරවරුන් විසින් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය උදෙසා ලබා දෙන දායකත්වය මෙම ගරු සභාව අගය කරන අතර, ඔවුන්ගේ වෘත්තිය නිපුනත්වය වර්ධනය කර ගනිමින් සේවා උසස්වීම් කරා යාමට ඇති ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීමට මංපෙත් විවෘත කළ යුතු යැයිද, එම ගුරුවරුන්ට විශේෂ පුහුණුවක් ලබා දී ඉගැන්වීමට අවශ්‍ය අවස්ථාව සලසා දී එමගින් වඩාත් තෘප්තිමත් ගුරු පරපුරක් බිහි කිරීමට හේතුවන පරිදි අවශ්‍ය වැඩ පිළිවෙළක් සකස් කළ යුතු යැයිද බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි.*"

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

**ගරු මෙරිල් පෙර්රා**
Hon. Meril Perera

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

[ පූ.භා. 11.46 ]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ උපාධිධාරීන්ට ගෞරවනීය තත්ත්වයකට පත් වෙන්න අවස්ථාව සලසා තිබෙනවා. රාජ්‍ය සේවය පුළුල් කරලා තිබෙනවා. ඒ වාගේම 2005 වසරේ සිට අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ අතිවිශාල උපාධිධාරීන් ප්‍රමාණයක් රාජ්‍ය සේවයට සම්බන්ධ කරගෙන තිබෙනවා. 2005 වසරේ 40,000 කට අධික උපාධිධාරීන් පිරිසකටත්, 2012, 2013 වර්ෂයේ 50,000 කට අධික උපාධිධාරීන් පිරිසක් ගුරු සේවය ඇතුළු සමස්ත රාජ්‍ය සේවයට ඇතුළත් කර ගැනීම මගින් රාජ්‍ය සේවයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමට රජය කටයුතු කර තිබෙනවා. එය කාගේත් ප්‍රශංසාවට ලක් වෙන්නක්. විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව අපේ ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ නායකත්වය යටතේ ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමේ ක්‍රමික වැඩ පිළිවෙළක් මගින් පළාතේ ගුරු අසමතුලිතතාවයන් සියල්ල මග හරවමින් පළාත තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුරුවරුන්ගේ දරුවන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් යෙදවෙන විධිමත් වැඩ පිළිවෙළක් යටතේ දිනෙන් දින උපාධිධාරීන් බඳවා ගැනීම සඳහා කටයුතු කරලා තිබීම ඉතාම සතුටට කරුණක් ලෙස අපි සලකනවා. විශේෂයෙන්ම මේ උපධිධාරීහූ ගුරුවරුන් ලෙස රාජ්‍ය සේවයට එක් වීමට වැඩි කැමැත්තක් දක්වනවා. අපේ රටේ රාජ්‍ය සේවකයා පිළිබඳව දශක තුනකට, අවුරුදු තිහකට පමණ පෙර තිබුණු දුර්මත ඉවත් කරලා අභිමානවත් සහිත සේවයක් බවට රාජ්‍ය සේවය පත් කරන්න සමත් වෙලා තිබෙනවා. මේ ගුරුවරුන් මේ තරම් ප්‍රමාණයක් එකට එකතු වෙන්න වැඩි කැමැත්තක් දක්වන්නේ ඒ නිසාය කියලා අපි විශ්වාස කරනවා. මා දැකලා තිබෙනවා. ඈත කාලයේ තිබුණු පත්තරවල, කාටූන්වල රාජ්‍ය සේවකයා උපමා කරන්නේ, ඉරුණු බෑග් එකක් ඇතිව, කඩමළු රෙදි ඇඳගත්තු තැනැත්තෙකුගේ ඡායාව ලෙසයි. ඒ විධියට එදා තමයි රාජ්‍ය සේවකයා නිරූපණය කරන කාටූන් ශිල්පියා දැක්කේ. ඒත් අද පෞද්ගලික අංශයේ සේවය පැත්තකට දාලා රාජ්‍ය සේවයට එක් වීමේ විශාල උනන්දුවක් දක්වන්නේ, ඔවුන් සඳහා විශේෂ පහසුකම් රජය විසින් සපයලා තිබෙන නිසා. ඒ නිසාම තමයි ගුරු සේවය සඳහා මෙසේ ඉල්ලීමක් කරලා තිබෙන්නේ. ඒ යටතේ තමයි උපාධිධාරීන්ට, ඉගෙන ගත්තු දරුවන්ට විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය ලත් දරුවන්ට, තමුන්ගේ දරුවන්ව විශ්ව විද්‍යාලයට යවන්න රුපියලක් හරි වැය කරපු ඒ ආදරණීය අම්මලා තාත්තලාගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න, තමන්ගේ දරුවා ගුරුවරයෙක් ලෙස අභිමානයෙන් ඊළඟ දරු පරම්පරාව ගොඩ නගන ආකාරය පිළිබඳව තෘප්තිමත්ව බලන්න අවශ්‍ය පරිසරය බස්නාහිර පළාත තුළ නිර්මාණය වෙලා තිබෙන එක ඉතා ප්‍රශංසනීය කාරණයක්. ඒක නිසා අපි විශ්වාස කරනවා විශේෂයෙන්ම ඒ ගුරුවරුන්ට තෘප්තිමත් භාවයෙන් යුතුව සේවය කිරීමට අවශ්‍ය මංපෙත් සලසා දිය යුතු වෙනවා. ඒ සඳහා විශේෂ පුහුණුවක් ගුරුවරුන්ට ලබා දීම අත්‍යවශ්‍ය වෙනවා.

ඒ වාගේම ඔවුන් උපාධිය සඳහා හදාරන ලද විෂයය. ඒ වාගේම ඔවුන් ලබා ඇති පශ්චාත් උපාධි. ඔවුන් ලබා ඇති පන්ති සාමාර්ථ. ඔවුන්ගේ සේවා උසස්වීම් ඇතුළු තමුන්ගේ උගන්වන විෂයය තීරණය කිරීමේදී වැඩි ලෙස සැලකිලිමත් විය යුතුයි කියන එක අපි මතක් කරනවා. ගුරුවරුන් පිළිබඳව කථා කරන මේ මොහොතේ සමස්ත රාජ්‍ය සේවය පසුබෑසීම් පිළිබඳ තත්ත්වයන් අපි දකිනවා. ඊයේ පෙරේදා මේ සභාවේ මතු වුණු

සිද්ධීන්. දැන් මොහොතකට කලින් ප්‍රකාශ කළා වාගේම අපි දන්නවා වයඹ පළාත් සභාවේ ඇති වුණු ඉතාම කනගාටුදායක තත්ත්වය. දෙවිවරු ලෙස සලකන ගුරුවරුන්ව මම හිතන්නේ එවැනි දණ ගැස්වීමක් කරන්නේ පාසලක අධ්‍යාපනය ලැබූ තැනැත්තෝද කියන සැකය අපට පවතිනවා. ඒ පළාත් සභා මන්ත්‍රීවරුන් පමණක් නොවෙයි. රාජ්‍ය සේවකයින්ට හිරිහැර කරන තැනැත්තෝ ඉන්නවා. අපි දන්නවා රාජ්‍ය සේවකයින්ව දණ ගස්වන, කඹවලින් බඳින -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගස් බඳින.

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

ගස් බඳින, හමුදා නිලධාරීන් වන රාජ්‍ය සේවකයින්ට උන්මත්තක පුත්තුවරු විසින් පහර දෙන අවස්ථා අපි දකිනවා. මේ සියලු තත්ත්වයන් නිවැරැදි කිරීම ඔස්සේ පමණයි අපේ රාජ්‍ය සේවයේ අභිමානවත්ව කටයුතු කිරීමට අවශ්‍ය වන ඉදිරි ක්‍රියා මාර්ගය ගන්නට පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා මේ අවාසනාවන්ත තත්ත්වයන්ගෙන් මුදවා ගෙන විශේෂයෙන්ම බස්නාහිර පළාතේ උපාධිධාරී ගුරුවරුන් - අපි විශ්වාස කරනවා, අපේ පළාතේ පැවතුණු ගුරු හිඟයන් දැන් ඇත්තේ නැහැයි කියලා. කැලණිය කලාපයේ, ඒ වාගේම මිනුවන්ගොඩ කලාපයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ඈත කළුතර දිස්ත්‍රික්කයේ විවිධ පළාත්වල පැවතුණු ගුරු හිඟයන් අද දකින්න පුළුවන්කමක් නැහැ. අද බස්නාහිර පළාත උපාධිධාරීන්ගෙන් පිරිලා. අදාළ විෂයයන් පිළිබඳ විශේෂඥ ගුරුවරු සිටිනවා. ඒ ගුරුවරු තෝරා ගැනීම සඳහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය නිශ්චිත වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පවතිනවා. මා නැවත වතාවක් ඔබතුමිය හරහා මේ සභාවේ අවධානය යොමු කරනවා. විශේෂයෙන්ම මා හිතනවා ඔවුන් අධ්‍යාපනය ලද විෂයයන් පිළිබඳව විශේෂ සැලකිල්ලකට ලක් කළ යුතු වෙනවා කියලා. විශේෂයෙන්ම අපි දන්නවා. ඇතැම්, උපාධිධාරීන් විශ්ව විද්‍යාල භූමිකාව තුළ විශේෂ පන්ති සමර්ථයන් ලබා ගත්තු, උසස් අධ්‍යාපනයේ දියුණුව ලබා ගත්තු තැනැත්තන් සිටිනවා. ඒ අය

[ ගරු සිසිර ජයකොඩි ]

වෙනුවෙන් විශේෂ ලකුණු දීමේ පටිපාටියක් දක්වා ගමන් කරන්න වෙනවා. අපි දන්නවා උපාධිධාරීන් බඳවා ගැනීමේදී මේ කරුණු සැලකිල්ලට ගැනීම දුෂ්කර බව. ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ මැදිහත් වීම මත පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව පවත්වන විභාගයෙන් සමත් වන සියලුම උපාධිධාරීන් 7500 ක් පමණ ප්‍රමාණයක් ඉන්නවා. ඒ සඳහා රැකියා ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. එය ඉතාම ප්‍රශංසනීය කටයුත්තක්. උපාධිධාරීන් බඳවා ගැනීමේ පටිපාටියට හානි නොවන ලෙස විශේෂයෙන්ම, අද උපාධිධාරීන් ලෙස බැඳෙන ගුරුවරයා වන්නේ, ඇතැම් වෙලාවට ඔවුන්, විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබලා අවුරුදු හතකට, අටකට, දහයකට පස්සේ තමයි ගුරුවරයෙක් බවට පත් වෙන්නේ. ඔවුන් දරුවා වෙත යන්නේ පුහුණුවකින් තොරව. ඔවුන් දරුවා වෙත යන්නේ තමන්ගේ විෂයය පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් රහිතව. න්‍යායික කරුණු අමතක කරලා තමයි දරුවෝ ඉස්සරහාට යන්නේ. පන්ති කාමරය ඉස්සරහා ඇය නිරුත්තර වුණොත් එහෙම විශාල ගැටළුවක් පවතිනවා. ඒ නිසා ඔවුන් දරුවන් ඉදිරියට යාමට පෙර ඔවුන්ට ඒ පිළිබඳව විශේෂ පුහුණුවක් ලබා දීම අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. ඒ තුළින් තමයි වඩාත් තෘප්තිමත් ගුරු පරපුරක් බිහි කිරීමේ හැකියාව ලැබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය ශක්තිය බස්නාහිර පළාත් සභාවට ලැබෙන්නය කියන ප්‍රාර්ථනය කරමින් මම මගේ පළමු කථාව අවසන් කරනවා. ඔබතුමියට ස්තුතියි.

[ පූ.භා. 11.55 ]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම හිතන්නේ මේ යෝජනාවත් අර දණගැස්සීමත් අතර මොකක් හරි සම්බන්ධයක් තිබෙනවාද කියලා පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නැහැ, නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මහින්ද චින්තන වැඩ පිළිවෙළේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව තමයි මෙතුමා මේ යෝජනාව ගෙනැල්ලා තිබෙන්නේ. ඒක නිසා මහින්ද චින්තන වැඩ පිළිවෙළේ අද වන දේවල් දැක්කාම අපට පුදුම හිතෙනවා, මෙවැනි යෝජනා අතිගරු ජනාධිපතිතුමාට හදලා දුන්නේ කවුද කියලා. යෝජනාව ගෙනාපු අපේ හිතවත් මන්ත්‍රීතුමා ගුරුවරුන්ගේ අභිමානය ගැන කථා කළා. මේ යෝජනාවේ තියෙනවා ඒ හදාරපු විෂයයම කරගෙන යන්න, උගන්වන්න -

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ඒක සංශෝධනය කළා නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක සංශෝධනය කරපු එකත් මම කියන්නම්. පොඩ්ඩක් ඔබතුමා ඒක අහගන්න. ඊට පස්සේ එක පාරක් සංශෝධනය වුණා. මොකද, අද ගුරුවරු බහුතරයක් හදාරපු විෂයය නොවෙයි උගන්වන්නේ. ඒක තමයි ඇත්ත කථාව. අපි දන්නවා ආගම

උගන්වන ගුරුවරු අද වෙන වෙන විෂයයන් උගන්වනවා. අද විෂයට අදාළ ගුරුවරු ප්‍රමාණයක් නැහැ. ගණිතයට අවශ්‍ය ගුරුවරු ප්‍රමාණය ඒක පුරවන්න බැහැ. මොකද, ගණිතය විෂයය හදාරපු ගුරුවරුන්ගේ හිඟයක් තිබෙනවා. ඒක නිසා තමයි මේ සංශෝධනයක් ගෙනාවේ. නැත්නම් වෙන මොකටවත් නොවෙයි සංශෝධනයක් ගෙනාවේ. ඒ කෙසේ වෙතත් අපි කියන්න ඕනෑ. අද අධ්‍යාපන ක්ෂේත්‍රය තුළම වෙන දේශපාලන ඇඟිලි ගැසීම් නිසා තමයි වයඹ පළාත් සභාවේ සිද්ධියත් වුණේ කියලා අපට කියන්න පුළුවන්. මීට පෙරත් මම කිව්වා අධීක්ෂණ මන්ත්‍රීවරු පත් වෙලා ඉන්නවා. දැන් අපේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමාත් කිව්වා අධ්‍යාපනයට සුදුසු මට්ටමේවත් උගත්කමක් නැති අය නිසා තමයි මේක වෙලා තිබෙන්නේ කියලා. ඒත් එක්කම තමයි මේකත් සම්බන්ධ වෙන්නේ. මම හිතන්නේ අපි පෙරත් කිව්වා, අට පාස් නැති අයත් අද අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට පත් කරලා ඉන්නවා කියලා. එතකොට අපට කැඟැහුවා. දැන් මේ සත්‍ය ටික ටික හෙළි වෙමින් එනවා. අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට පත් කරලා අද පාසල්වල විදුහල්පතිවරුන් ළමයි ගන්නේ ඒ අයගේ ලැයිස්තුවලට. අධීක්ෂණ මන්ත්‍රීවරු -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම දන්නේ නැහැ අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට පත් කළේ කවුද කියලා. එහෙම පත්වීම ලබා දීලා තිබෙන්නේ කවුද කිව්වොත් මට හොයලා බලන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා එදා නැහැ කිව්වාට, ඊට පස්සේ කථා කරපු මන්ත්‍රීතුමා නැගිටලාම කිව්වා අධීක්ෂණ මන්ත්‍රීවරයා මමයි කියලා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි. මම වගකීමෙන් කියනවා මේ සභාවේ කිසිම අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් කිසිම විෂයයකට පත් කිරීමක් කරලා නැහැ. ව්‍යූහ කමිටුව හරහා තමයි කරන්නේ. ඒ නිසා මෙතුමා නොදන්න දේවල්වලට, වැරැදි අර්ථකථන දීම හරහා මාධ්‍ය හරහා වැරැදි ප්‍රචාරයක් ගෙනියනවා. ඔබතුමියගේ නිවැරැදි කිරීම සඳහා යොමු කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

එතුමා පැහැදිලි කිරීමක් කළා. ඒ නිසා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම ඉතාමත් වගකීමෙන් කියනවා. ලිඛිත ලියුම දැන් අයින් කරගෙන තිබෙනවා. ඒක ඇත්ත.

[සභාවේ ඝෝෂා]

කිසිම අවස්ථාවක දීලා නැති වුණාට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

වගකීම ගන්න බැහැ නේ? ලිඛිතව දීලා තිබෙනවා නම් -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලිඛිතව නැති වුණත් අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට මන්ත්‍රීවරු ක්‍රියා කරනවා. ඒක නිසා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විෂයය භාර ගරු අමාත්‍යවරයා වගකීමක් ඇතුව ප්‍රකාශයක් කළාට පස්සේ ඒ සම්බන්ධව වගකීමක් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට දරන්න බැහැ. ඒ නිසා කරුණාකරලා ඔබතුමා ඉස්සෙල්ලා නිවැරැදි කිරීමක් කරලා - ඔබතුමාගේ පක්ෂය පිළිබඳව නිවැරැදි කිරීම මම නිහතමානීව භාර ගත්තා. ඒ නිසා මම හිතන්නේ, මේ සභාවේ ගෞරවය රකින්න මන්ත්‍රීවරු හැටියට අපි බැඳිලා සිටිනවා. ඒ නිසා ඔබතුමාගෙන් මම බලාපොරොත්තු වෙනවා, ගෞරවනීය ලෙස -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කියන්නේ මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු නැති බලයක් අද පාවිච්චි කරනවා. ඒ නිසා තමයි මේ සිද්ධීන් සිද්ධ වෙන්නේ. දැන් අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා නැහැ කිව්වාට - අපි දන්නවා, ගරු මහ ඇමැතිතුමා පත් කරලා නැහැ කියලා. නමුත් එවැනි බලයක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි බොරු කියලා නොමග යවන්නේ ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එවැනි බලයක් ලිඛිතව නැති වුණාට එවැනි දේවල් සිද්ධ වෙනවා. අද මම -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මොකක්ද සිද්ධ වෙලා තියෙන්නේ? කියන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

සභාව කුපිත කිරීම්වලට ලක් වන්නේ නැතුව දැන් පැහැදිලිව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම වගකීමෙන් කියනවා -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මෙතුමා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට චෝදනා කරනවා. එවැනි කාරණයක් තිබුණා නම් එය පාවිච්චි කරන මන්ත්‍රීවරයෙක් සම්බන්ධව ගරු ප්‍රධාන ඇමැතිතුමාට හෝ මේ සභාවේදී කලින් ප්‍රකාශ කරන්න තිබුණා. මේ විවාදයේදී අසත්‍ය ප්‍රකාශ කිරීම සම්බන්ධව අපි කනගාටු වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කථා කරන වෙලාවට ඒක කියන්න කෝ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපේ වරප්‍රසාදයක්. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීමක්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද කඩවීමක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉවරද? ඉවරද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඒ නිසා එවැනි පුද්ගලයෙකුගේ නමක් දන්නවා නම් -

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

අපේ වරප්‍රසාද කඩවීමක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉවරද? දැන් හරිද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඉවර නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉවර නැත්නම් කථා කරලා මට කථා කරන්න දෙන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

එවැනි පුද්ගලයෙකුගේ නමක් දන්නවා නම් ඔබතුමා පුද්ගලයාගේ නම කියලා කථා කරන්න. එහෙම නැත්නම් ඒ වාගේ ප්‍රකාශ කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කදානේ ශාන්ත සෙබස්තියන් විදුහලට ළමයි 19 දෙනෙකු දැමීමට ඒ නාම ලේඛනය, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගෙන් ලියුම් අරගෙන එන්න කියලා තියෙනවා. ළමයින්ව ඉස්කෝලයට දා ගන්න දෙමව්පියන්ට කියනවා, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගෙන් ලියුමක් අරගෙන එන්න කියලා. එවැනි 19 දෙනෙකුගේ ලැයිස්තුවක් -

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඒත් කටකථාවක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක කටකථාවක් නොවෙයි. ඇත්ත කථාව. එවැනි ලැයිස්තුවක් කොහොමද අධීක්ෂණ මන්ත්‍රීවරයෙන් නැතුව, එහෙම නැත්නම් යම්කිසි බලතලයක් නැතුව කොහොමද ලැයිස්තුවක් මන්ත්‍රීවරයෙක් පාසලකට දෙන්නේ. පාසලට ළමුන් බඳවා ගන්නේ, විදුහල්පතිතුමා ඇතුළු ඒ ඉන්න කණ්ඩායමක් එකතු වෙලා Interview එකක් කරලා තමයි -

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඔය කියන කථා ලිඛිතව දෙන්න කෝ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

19 දෙනෙකුගේ ලැයිස්තුවක් -

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

කාගේ හරි කේලමක් අහගෙන ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. මෙතුමාගේ කථාවේදී මගේ නම කිව්වා. විදුහල්පතිතුමියට හෝ කාගේ හරි කවරෙකුට හරි නාම ලේඛනයක් මගේ පළාත් සභා Letter Head එකක ගහලා දීලා තිබෙනවා නම් එතුමාට ඔප්පු කරලා පෙන්වන්න කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අන්න ඕක තමයි කියන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, Letter Head එකක ගහලා තිබෙනවා නම් ඔප්පු කරන්නලු.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැත්නම් මොකේද ගහන්නේ?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඕනෑම කෙනෙකුට වාචිකව අපහාස -

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තමුන්නාන්සේ මෙතැනට ඇවිල්ලා නිකම් බොරු කියන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

19 ක් නොවෙයි 29 ක් හරි දානවා, දාන්න පුළුවන් නම්.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

නැත්නම් ඒක චෝදනාවක් හැටියට අපි පිළිගන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තමුන්නාන්සේ නොමග අරින්නේ නැතුව ඇත්ත කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ වෙන හැම දෙයකම Letter Head එකේ වෙනවා නම් -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා 19 ක් නොවෙයි. 29 ක් දාන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

දැන් තමුන්නාන්සේ කිව්වා නේ නම් 19 ක් ඇරලා තිබෙනවා කියලා. ඒක ඔප්පු කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, Letter Head -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට තව විනාඩියක් පමණයි තියෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ රටේ වෙන දේවල් ඔක්කෝම Letter Head වල ලියලා යවනවා නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙතුමා හතර මායිම අඳුරන්නේ නැහැ. තියෙන පාසල් ගණන දන්නේ නැහැ. ඉන්න ළමයි ගණන දන්නේ නැහැ. ඉන්න ගුරුවරු ගණන දන්නේ නැහැ. ඒවා දන්නේ නැතුව මොනවාද මේ අධ්‍යාපනය ගැන කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා හොඳට දන්නවා. මෙතුමා සංඛ්‍යා ලේඛන ගැන විශේෂඥයෙක්. මෙතුමා පැය ගණන් දන්නවා. ගුරුවරුන් ගණනත් දන්නවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මන්ත්‍රීතුමා කරුණාකරලා මූලාසනයට කථා කරන්න. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

පුළුවන් නම් පාසල්වල නම් ටික කියාගෙන යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කරන්න දෙනවාද? නැත්නම් එතුමාට කථා කරන්න දෙනවාද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හතර මායිම අඳුරන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා එක එක්කෙනා කුපිත වෙන විධියට බොරු චෝදනා දමමින් කථා කරනකොට තමයි එවැනි දේවල් සිද්ධ වෙන්නේ. ඒ නිසා මූලාසනයට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනයට තමයි මම කථා කරන්නේ. මම වෙන කාටවත් කථා කරන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජා-ඇළ හතර මායිම දන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජා-ඇළ හතර මායිම අහන්න ඕනෑ ජා-ඇළ ඉපදුණු කෙනෙකුගෙන්. ජා-ඇළ හතර මායිමේ ඉපදුණු කෙනෙක්ගෙන් අහන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ඔබතුමා එංගලන්තේ නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජා-ඇළ ඉපදුණු අයගෙන් හතර මායිම මගෙන් අහන්න ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නුවර ඉපදිලා, ජා-ඇළ හතර මායිම මගෙන් අහනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ලැජ්ජා නැහැ.

[සභාවේ ඝෝෂා]

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

සභාව නිශ්ශබ්ද වෙන්න. යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාට මම ආරාධනා කරනවා. ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මගේ කථාවට වෙලාව ඕනෑ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට නියමිත වේලාව දුන්නා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

විනාඩියක් විතරයි කියලත් කිව්වා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මම විශ්වාස කරනවා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට වෙලාව දුන්නේ නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඒකට මට කරන්න දෙයක් නැහැ. තමුන් දැන ගන්න ඕනෑ වටේ අය කුපිත කරගන්නේ නැතුව කථා කරන්න.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක මගේ වරප්‍රසාදයක්. ඔබතුමියට පක්ෂපාතීව තීරණය කරන්න බැහැ මොනවාද කරන්නේ කියලා. මම වාඩි වෙන්නේ නැහැ මම කථා කරනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එළියට දාන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුළුවන් නම් එළියට දාන්න.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

විවිධ අදහස් මේ සභාවේ ඉදිරිපත් කළා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා නිකම් බොරුවට වීරයෙක් වෙන්න -

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඒ අදහස් -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ඒ අදහස්වලට පටහැනිව -

[සභාවේ ඝෝෂා]

ප්‍රතිඵලයක් වශයෙන් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමිය මගේ නියමිත කාලය මට දුන්නේ නැහැ.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

නැහැ, ඔබතුමාට ලබා දුන්නා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආණ්ඩු පක්ෂයේ -

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

විෂයය පථයට පටහැනිව කථා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් සභාව නොසන්සුන් තත්ත්වයට පත් වුණේ. ඒක නිසා මම මගේ කථාව ආරම්භ කිරීමට කලින් බලාපොරොත්තු වෙනවා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමාගේ කථාව පිළිබඳව මගේ ප්‍රශ්නයක් නැහැ. මගේ කථාව -

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමාට සභාවේ කථා කරන කොට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාට මම විනාඩි 02 ක් ලබා දෙනවා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

සභාවේ කථා කරන කොට යම් මන්ත්‍රීවරයෙක් යම් යෝජනාවක් ගෙනාවට පස්සේ ඒ යෝජනාවේ කරුණුවලට අනුව, ඒ යෝජනාවේ පෙන්වා දුන් කරුණු කාරණාවලට ගැළපෙන ආකාරයට සභාවේ කථා කරන්න -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අර කැමරා ටික අයින් කළා නම් ගැටළුවක් නැහැ.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

කථා කරන්න පුළුවන් කියන විශ්වාසයක් මා තුළ තිබෙනවා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමා මූලාසයට කන් දෙන්නේ නැහැ. දැන් මම අවස්ථාව දෙන්න හැදුවේ.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මූලාසානරූඪ ගරු මන්ත්‍රීතුමිය මගින් මම ඉල්ලා සිටිනවා විපක්‍ෂ නායකතුමාගෙන් තමන්ගේ මන්ත්‍රීවරුන්ට -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා සමාවෙලා විනාඩියක් නිශ්ශබ්ද වෙන්න. හැබැයි වටේ ඉන්න අයට අනවශ්‍ය වචන කියලා කුපිත කරන්නේ නැතුව තමුන්නාන්සේගේ අදහස් ටික කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කාටවත් කුපිත කළේ නැහැ. ඒ අය කුපිත වුණාට මට කරන්න දෙයකුත් නැහැ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මූලාසනයට කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බොහොම ස්තුතියි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම කිව්වේ අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ මේ අසීමිත බලයක්, බලය නැති කොටසක් විසින් පාවිච්චි කිරීම නිසයි. ඒකයි මම කිව්වේ. මෙතුමන්ලාට පොඩ්ඩක් කේන්ති ගියාට ඒකට මට කරන්න දෙයක් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා තමයි අද අධ්‍යාපන ක්ෂේත්‍රයටම මෙවැනි තත්ත්වයක් උදා වෙලා තිබෙන්නේ. ගුරුවරුන්ට මෙවැනි යෝජනාවක් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

තාත්තා ගම වටේ එක්කරගෙන යන්නේ. පුතා පාරවල් දන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙවැනි යෝජනාවක් ගෙන ඒම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. හොඳ යෝජනාවක්. නමුත් මෙතැන නොවෙයි ප්‍රශ්නය
[ ගරු ශ්‍රීනාත් පෙරේරා ]

තිබෙන්නේ. ප්‍රශ්නය තිබෙන්නේ අද නොයෙකුත් අයව පත් කරලා, (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ප්‍රශ්නය කොහේද තියෙන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අධ්‍යාපන ක්ෂේත්‍රයම අද බිඳ දමන්න ක්‍රියා කරන මේ පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළුව අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් මේ චෝදනාව තිබෙනවා. දේශපාලනය අධ්‍යාපනයේ හැම කොණකටම ඇහිලි ගහලා තිබෙන නිසා තමයි මෙවැනි තත්ත්වයක් අද උදා වෙලා තිබෙන්නේ. ඒක තමයි මම කියන්න හැදුවේ. ඒ නිසා මෙතුමන්ලාට ඒක අහගෙන ඉන්න බැරි වුණාට මට කරන්න දෙයක් නැහැ. ඇත්ත කියපුවාම හුහක් කට්ටියට හිත රිදෙනවා. ඒක නිසා ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට කියනවා. මම ජා-ඇළ ආසනයේ හතර කොණ කියන්න ඉස්සෙල්ලා, එතුමා ඉපදිලා ඉන්න නුවර පැත්තෙන් අහගෙන එන්න කියන්න හතර කොණ කොහේද තියෙන්නේ කියලා. මට එතුමාට ජා-ඇළ හතර කොණ ගැන -

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඔබතුමාගේ දුර්වලකම ඕක නේ? කථා කරන්න කිව්වාම කථිකයෙකුගේ දක්ෂකම තමයි -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මළ ගෙවල්වල තාත්තා එක්කරගෙන යන්නේ.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

අනෙක් අයට අහගෙන ඉන්න පුළුවන් විධියට කථා කිරීම. ඉතින් හැමදාම මම දැකලා තිබෙනවා, ඔබතුමා ඒ විධියට කථා කරන්නේ නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ගිය අවුරුද්දේ අගෝස්තු මාසේ මේ සභාවට පෙත්සමක් ඉදිරිපත් කළා. ඒ පෙත්සම 2012.10.30 වෙනිදා විභාග කරලා ඉවර වෙලා තීන්දුවකුත් දුන්නා. වත්තල ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් තමයි මේ පෙත්සම ඉදිරිපත් කළේ. තීන්දුව දුන්නේ ප්‍රාදේශීය සභා ඉඩමේ අනවසරයෙන් ගෙයක් හදාගෙන ඉන්නවා. මේක වාහම ක්‍රීඩා පිටියෙන් ඉවත් කරන්න කියලා එතකොට තීන්දුව දුන්නා,

*"ඉදිරිපත් කරන ලද කරුණු අනුව ක්‍රීඩා පිටියට අයත් භූමියෙන් කොටසක් අල්ලාගෙන ඇති බව පැහැදිලි වන බැවින් රජය සතු ඉඩමක් අනවසරයෙන් අත්පත් කර ගැනීම පිළිබඳව වහාම*

*නීතිමය පියවර ගෙන මාස තුනක් ඇතුළත වාර්තා කරන ලෙස ප්‍රාදේශීය සභාවට දැනුම් දෙනවා කියලා."*

ඊට පස්සේ මාස තුනක් ගිහිල්ලා හතර වැනි මාසේ මම නැවතත් සභාපතිතුමා ඉන්න වෙලාවේදී කිව්වා, මේක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ පුද්ගලයා යහතින් ඉන්නවා කියලා. දැන් වනකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ප්‍රාදේශීය සභාව මේ පළාත් සභාව, මේ පෙත්සම් කාරක සභාව කොපමණ හැල්ලුවට පත් කරනවාද කියනවා නම්, මේ මාසේ 6 වැනිදා ඒ අනවසර ගොඩනැගිල්ලට වරිපනම් අංකයකුත් නිකුත් කරලා නීත්‍යානුකූල කරලා දීලා තිබෙනවා. ඉතින් මම අහන්නේ. මේ පළාත් සභාවට ඇවිල්ලා, පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් කරලා, පෙත්සම් කාරක සභාවේ වගකිව යුතු නිලධාරීන්, මන්ත්‍රීවරු තීන්දුවක් දීලා, ඒ තීන්දුව පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට ක්‍රියාත්මක කරන්න බැරුව, ශත පහකට තුට්ටුවකට ගණන් ගන්නේ නැතුව තිබෙන අවස්ථාවක මෙතැනින් එහා ගන්න ඕනෑ පියවර මොකක්ද කියන එක පිළිබඳව ඔබතුමියගේ අවධානය යොමු කරනවා, මේ පිළිබඳව වැඩිදුර කටයුතු කරන්න කියලා. මොකද, මම දන්නේ නැහැ මෙතැනින් එහාට මොකක්ද වෙන්නේ කියලා. ඉතින් එහෙම නම් මේ පළාත් සභාවට පෙත්සම් ඉදිරිපත් කිරීම නිෂ්ඵලයි. පෙත්සම් විභාග කිරීම නිෂ්ඵලයි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු මන්ත්‍රීතුමා, පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඔය පෙත්සමේ නියෝගය දීලා තිබෙන්නේ කාටද?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාට.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

එතැනයි වැරැද්ද.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඉතින් එතුමා නේ බලධාරියා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ක්‍රියාවලියේ වැරැද්දක් තිබෙන්නේ. අපේ පෙත්සම් කාරක සභාවේ –

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම නම් පෙත්සම් කාරක සභාව වැරැදියි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

මම හිතන්නේ ඔය ක්‍රියාවලිය නිවැරදි වෙන්න ඕනෑ. පෙත්සම් කාරක සභාවට එහෙම නියෝගයක් දෙන්න බැහැ. පෙත්සම් කාරක සභාවට තිබෙන්නේ, ගරු සභාපතිතුමා, ගරු ඇමැතිතුමාට නිර්දේශයක් ඉදිරිපත් කරන්න. ගරු අමාත්‍යතුමාට නිර්දේශය ඉදිරිපත් කළාට පස්සේ ගරු ඇමැතිතුමා ඒ පිළිබඳව පළාත් පාලන කොමසාරිස් හරහා නියෝග යවන්න ඕනෑ. සෘජුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරුන්ට නියෝග දීමේ බලයක් අපට නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කොහොම හරි පසුගිය සතිය වනකොට වරිපනම් අංකයකුත් නිකුත් කරලා.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඒක අපි විෂයය භාර ඇමැතිතුමාට යොමු කරමු.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

පැහැදිලිවම මේක ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩා පිටිය.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඕක සභාගත කරන්න. අපි විෂයය භාර ඇමැතිතුමාට –

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

නැවත පෙත්සම් කාරක සභාවට යොමු කරන්න ඕනෑ. ඒ උඩ පුළුවන් පෙත්සම් කාරක සභාවට යම් ක්‍රියා මාර්ගයක් ගන්න.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මෙය සභා කටයුතු කාරක සභාවට යොමු කරලා සාධාරණ තීරණයක් ගන්න කියලා මම ඉල්ලා සිටිනවා. මීළඟට යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[ අ.භා. 12.09 ]

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සභාවේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා අද ඉතාමත්ම කාලෝචිත, ඉතාමත්ම වටිනා කියන යෝජනාවක් කරුණු කාරණා ඇතුව සභාවට ඉදිරිපත් කළා. ඒ යෝජනාව ඔස්සේ අපට තේරුම් ගිය ආකාරයට යම්කිසි පුහුණුවීම් කටයුතු, ගුරුවරයා තෘප්තිමත් වන යම්කිසි වෙනස්වීම්

ඇති කොට, ඒ තෘප්තිමත්භාවය තුළින් දරුවන්ට අධ්‍යාපනයේ සංවර්ධනයක් ක්‍රියා කරන ආකාරයට වැඩ පිළිවෙළක් සාකච්ඡා කරනවා වෙනුවට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය තුළින්, ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා සභාවට පෙන්වා දෙන්න ගිය පැටහැනි කරුණු තුළින් යම්කිසි ආකාරයේ ආන්දෝලනාත්මක ස්වභාවයක් මේ සභාව තුළ සිදු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පෙන්වා දෙනවා, මේ රටේ යම් යම් සත්තු, යම් යම් මිනිස්සු ක්‍රියා කරන ක්‍රියාදාමවලට අනුව නම් පැටබැඳීමක් සිදුවන ආකාරය. කාක්කෝ කාක් කාක් කියන නිසා කාක්කා කියනවා. සමාජයේ පිළිගන්නේ නැති නැත්නම් අසුභවාදී වැඩ කරනකොට බල්ලා කියලා කියනවා. මෝඩ වැඩ කරන සත්තුන්ට කියනවා හරකා කියලා. ඒ වාගේම අපේ සභාව තුළත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ මන්ත්‍රීවරුන්ට මම පෙන්වා දෙනවා අපේ සංවිධායකවරු මඟින්. එහෙම නැත්නම් ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා මඟින්. විපක්ෂයේ විපක්ෂ නායකතුමා මඟින්. තමන්ගේ ක්‍රියා කලාපය මත මන්ත්‍රීවරුන්ට විවිධ නම් කියලා මේ සභාවේ කියනවා අපි ඇහුම්කම් දෙනවා. ඒක නිසා ඒ නම් ඇහුම්කන් දීම ඉතාමත් අශෝභනයි කියලයි මම විශ්වාස කරන්නේ. ඒ නිසා ඔබතුමිය විපක්ෂ නායකතුමා මඟින්. පෙන්වා දෙන්න උත්සාහ කරන්න, එවැනි මන්ත්‍රීවරු ඉන්නවා නම් තමන් සභාවට ගැළපෙන ආකාරයට තමන්ගේ ක්‍රියා කලාපය ක්‍රියා කරන්න කියලා. එතකොට ඒ වාගේ අසුභවාදී, එහෙම නැත්නම් ගැළපෙන්නේ නැති නම් පට බැඳීමක් මේ සභාව තුළ ආන්දෝලනය වෙන එකක් නැහැ. මොකද, එහෙම වෙන්න හේතු කාරණා තමයි මම හිතන්නේ, සමහර මන්ත්‍රීවරු තමන්ගේ පියාගේ හරි, තමන්ගේ බාප්පාගේ හරි කාගේ හරි අතේ එල්ලිලා ගිහිල්ලා තමයි දේශපාලනය කරන්න හදන්නේ. එහෙම වුණාට පස්සේ පාසල් කීයද? මේ පාසලේ දරුවන් කොපමණද? මේ පාසලේ ගුරුවරු හිඟයක් තිබෙනවාද? මේ කොට්ඨාශයේ අධ්‍යාපන තත්ත්වය මොකක්ද? මේවා පිළිබඳව අවබෝධයක් නැතුව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලය උඩ තමයි මේ අපි ඉතාමත් වැදගත් යෝජනාවක් ගෙනාපු අවස්ථාවේ අපට ඒ යෝජනාව ඔස්සේ කථා කරන්න අවස්ථාව නොලැබුණේ. සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවේ වටේ සාරාංශය බැලුවාම තිබෙන්නේ, ගුරුවරයා හොඳ පුහුණු ගුරුවරයෙක් බවට පාසල් පද්ධතියට දායාද කරන්න ඕනෑ කියන කථාවයි. සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා පෙන්වා දෙන්න උත්සාහ කළේ ඒක තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගුරු විද්‍යාලවලින් පිට වෙලා, ගුරු විද්‍යාලවලින් පාසල් කරා ළඟා වන ගුරුවරු ඉතාමත්ම විධිමත් ආකාරයේ පුහුණුව ලබපු අයයි. එවැනි ගුරු පද්ධතියක් අපේ පාසල් පද්ධතිය තුළට දායාද වුණා. දායාද වෙනවා. මෙයට අමතරව අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමා එතුමාගේ විශාල අධ්‍යාපන දැක්ම තුළ පාසල තුළ මීට අවුරුදු පහකට හයකට කලින් තිබුණු අවිධිමත් ගුරු පද්ධතිය,

[ ගරු යසපාල කෝරළගේ ]

ඉතාමත් අඩු පුරප්පාඩු සංඛ්‍යාව, අද තුනී කරගෙන, අවශ්‍ය කරන ආකාරයට සියලු පාසල්වලට ගුරුවරු ලබා දීමේ වැඩ සටහනක් පළාත් සභාව තුළ ක්‍රියාත්මක වුණා. ඒ තුළ අද ගුරු හිඟයක් නැහැ. නමුත් මේ ගුරුවරු පුහුණු කිරීමේ ක්‍රමවේදයක්, ගුරු පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් දියත් කරන්නය කියන එක තමයි සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා අපට මේ සභාවේ පෙන්වා දෙන්න උත්සාහ කළේ. එතකොට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ යෝජනාවේ වෙනසක් කළේ, ඒ විෂයයට අනුව ගුරුවරු දෙන්න බැරි නිසාය කියලා. මම අවුරුදු 15 ක් රජයේ ගුරු සේවයේ හිටපු ගුරුවරයෙක් වශයෙන් පෙන්වා දෙනවා. ගුරු වෘත්තියේ ඉන්න අයට පුළුවන්කමක් තිබෙන්න ඕනෑ - අපේ මේ හැම ගුරුවරයෙක්ම අ.පො.ස. (සාමාන්‍ය පෙළ) දක්වා මේ සියලු විෂයයන් සමත් වෙලා තිබෙනවා. බුද්ධාගම සමත් වෙලා තිබෙනවා. සිංහල සමත් වෙලා තිබෙනවා. ගණිතය සමත් වෙලා තිබෙනවා. විද්‍යාව සමත් වෙලා තිබෙනවා. මේ සියලු විෂයයන් සමත් වෙලා තිබෙනවා. මම දන්නේ නැහැ, මම නම් ගුරුවරයෙක් වශයෙන් ඕනෑම වෙලාවක පන්තියකට ගියා නම් ඒ පන්තියේ ඒ විෂයය මට කරන්න පුළුවන්කමක් තිබෙනවා. 10 වෙනි ශ්‍රේණිය දක්වා. නැත්නම් 11 ශ්‍රේණිය දක්වා. ගුරු පුහුණුවක් තුළින් තමන් තව තවත් විෂයය කරුණු කාරණා ඔප නැංවීම වෙන කථාවක්. නමුත් වැඩ කිරීමේ ක්‍රමවේදයක් නැහැ. එහෙම නැතුව ගණිතයට වෙනම ගුරුවරයෙක්. බුද්ධාගමට වෙනම ගුරුවරයෙක්. එහෙම ගුරුවරු ඉන්නවා තමයි. මේ කලා විෂයය ධාරාව තුළ ගුරු උපාධිය ලබා ගත්තු අය තමයි මේවාට හුරු වෙන්නේ. මේ ගුරු පුහුණුව තුළ ලබා ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැතුව විශ්ව විද්‍යාලයේ බුද්ධාගම ගුරුවරු වෙනම. බුද්ධාගම විෂයය විතරක් කරන අය වෙනම. එහෙම පිටත් වෙන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඒක නිසා විධිමත් ආකාරයේ ගුරු පුහුණු ක්‍රමවේදයක් සකස් කිරීම ඉතාමත් කාලෝචිතයි කියන එක මම මේ අවස්ථාවේදී පෙන්වා දෙමින් මේ යෝජනාවට ඉතාමත්ම ගරු කරමින් ගරු ප්‍රධාන ඇමැතිතුමා අපේ මේ බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ගෙන යන ඉතාමත්ම පුළුල් වැඩ පිළිවෙළ මට මේ එහා පැත්තේ ඉන්න ශ්‍රීනාත් පෙරේරා වාගේ ගරු මන්ත්‍රීතුමන්ලාට තේරෙන්නේ නැත්තේ මොකක්ද කියන එක පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි මට හිතා ගන්න බැහැ. මම කියන්නේ අධීක්ෂණ මන්ත්‍රී කථාවක් දිගින් දිගට එතුමා පෙන්වා දුන්නා. ගරු ප්‍රධාන ඇමැතිතුමා අපි සියලු දෙනාට අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධීක්ෂණය කරන්න භාර දීලා තිබෙනවා. ස්වෙච්ඡාවෙන්. වෙනම දීලා නැහැ. අපේ කමිටුවේ ඉන්නවා එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා. මේ සියලු මන්ත්‍රීතුමන්ලා අපි එකම මේසයක ඉඳගෙන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු ඇතුළු නිලධාරී මණ්ඩලය අරගෙන අපි මුළු පාසල් පද්ධතියම අධීක්ෂණය කරනවා. ව්‍යුහ කමිටුවෙන්. ව්‍යුහ කමිටුවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ට අධ්‍යාපන

ක්ෂේත්‍රයේ තමන්ගේ කොට්ඨාශය, තමන්ගේ කලාපය අධීක්ෂණය කරන්නය කියලා මහ ඇමැතිතුමා කියලා තිබෙනවා. මොකද, එතුමාට පුළුවන්කමක් නැහැ මුළු බස්නාහිර පළාතේම තිබෙන ඉස්කෝලවලට යන්න. අපේ කොට්ඨාශවල අපි යන්න ඕනෑ. කලාප 11 ම යන්න පුළුවන්කමක් නැහැ. කොට්ඨාශ 38 ම යන්න පුළුවන්කමක් නැහැ. අපි යන්න ඕනෑ, අපේ කොට්ඨාශයට අපේ කොට්ඨාශයේ පාසල් කීයද තිබෙන්නේ? දරුවන් කීයද ඉන්නේ? ගුරුවරු කීයක් ඉන්නවාද? මේ සියල්ලක් අපි දැන ගන්න ඕනෑ අධ්‍යාපනය පිළිබඳව කථා කරන්න. ඒ නිසා ඒ පිළිබඳව අපි හරි දැක්මක්, හරි අවබෝධයක් මේ ව්‍යුහ කමිටු තුළින් අපි අරගත්තා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒක නිසා එවැනි අවබෝධයක් නැති එක්සත් ජාතික පක්ෂයේ මෙවැනි මන්ත්‍රීවරුන්ට එහෙම නැත්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මගින් විපක්ෂයේ නායකතුමාගෙන් ඉල්ලනවා මීට වඩා අධ්‍යාපනය ක්ෂේත්‍රය තුළ බස්නාහිර පළාතේ ගෙනියන වැඩ පිළිවෙළ අවබෝධ කර ගන්නය කියලා ඉල්ලා සිටිමින් සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් කාලෝචිතයි, ප්‍රශංසනීයයි කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.17 ]

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පස්වැනි පළාත් සභාවට පැමිණි පළමුවැනි දිනයේම යෝජනාවක් සම්බන්ධයෙන් කථා කිරීමට ලැබීම මම සතුටක් කොට සලකනවා. විශේෂයෙන්ම මානව හිතවාදී පුද්ගලයෙක් හැටියට අපේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන්. නමුත් අනෙක් පැත්තෙන් මම කනගාටු වෙනවා. මොකද, තුන්වැනි, හතරවැනි පළාත් සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට අද මේ සභාව තුළ විපක්ෂයේ හඬක් නැගීමේ හැකියාව තිබෙනවාද කියන ගැටළුව මම හිතන්නේ අද විශාල අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ පසුගිය තුන්වැනි, හතරවැනි පළාත් සභා තුළ ඉතා වැදගත් ඒ වාගේම පළාතට වටිනා යෝජනා රාශියක් එදා සම්මත වුණා. ක්‍රියාත්මක වුණා. ඒ වාගේම අනෙක් පැත්තෙන් අණපනත් හැම එකක්ම එදා ක්‍රියාත්මක වුණා. මම මේ ඇවිල්ලා හිටපු පැය ගණන තුළදී මම හිතන්නේ අපේ යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේම අද මෙතැන සත්තුන්ගේ නම් තමයි කියැවුණේ. ඉතින් ඒක මම දකින්නේ යහපත් ක්‍රියාවක් හැටියට නොවෙයි. මේ හැම කෙනෙක්ම අද උත්සාහ කරනනේ ස්තෝත්‍ර ගායනා කරන්න. එහෙම නැත්නම් මහින්ද චින්තනය ගැන කථා කරන්න. මීන් බැහැරව මේ අයට දෙයක් නැහැයි කියන එක තමයි මට මෙතැනදී අවබෝධ වුණේ. ඒ නිසා අපි දන්නවා අද මේ මහින්ද චින්තනය තුළින් මේ රටේ ජනතාවට අත් වෙලා තිබෙන ඉරණම මොකක්ද කියන එක පිළිබඳව. අද අධ්‍යාපන ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි. හැම ක්ෂේත්‍රයක්ම කඩා බිඳ වැටිලා තිබෙනවා. ඒ නිසා තමයි අද විශේෂයෙන්ම සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා මේ යෝජනාව ගෙන ඒම තුළත් එතුමාගේ කථාවේදී කියැවුණා, මේ කැලණිය ප්‍රදේශය වාගේම ඊයේ පෙරේදා සිද්ධියක් හැටියට පුත්තලම් දිස්ත්‍රික්කයේ පළාත් සභා මන්ත්‍රීවරයෙක් කටයුතු කරපු ආකාරය පිළිබඳවත් කියැවුණා. ඒ වාගේම අපි දැක්කා, මට ඒ අවස්ථාවේ මේ පළාත් සභාව නියෝජනය කරන්න නොලැබුණත්, ගම්පහ දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමැතිවරයෙක් රන්පොකුණුගම විද්‍යාලයට ගිහිල්ලා ගුරුවරයෙකු දණ ගස්සපු ආකාරය අපි පුවත්පත් වාර්තාවල දැක්කා. ඒවා එකක්වත් මම හිතන්නේ සමාජයක් හැටියට අපි කවුරුවත් අනුමත කරන දේවල් නොවෙයි. විශේෂයෙන්ම මහජන නියෝජිතයින් හැටියට. ඉතින් මේ පළමුවැනි දේ නොවෙයි. මේ අවසානයත් නොවෙයි. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලය තුළ තමයි මේ වාගේ අවාසනාවන්ත සිද්ධීන්වලට මේ රටේ ජනතාව මුහුණ දීලා තිබෙන්නේ කියන එක මම පැහැදිලිව ප්‍රකාශ කරනවා. (බාධා කිරීම්) මොකද අද ප්‍රාදේශීය සභාවක සභාතිවරයෙක් බැලුවොත් මිනී මැරුම් චෝදනාවකට ලක් වෙලා. අනිවාර්යයෙන්ම සිරගත වෙනවා. ඉතින් මේ ආකාරයට ආණ්ඩු පක්ෂයේ බහුතරය, විපක්ෂයේ නැහැයි කියන එක නොවෙයි. බහුතරයක් ගැන බැලුවොත් අල්ලස් දූෂණවලට ලක් වන අවස්ථා තමයි දකින්නේ. සාපරාධී ක්‍රියාවලට ලක් වන අය තමයි දකින්න තිබෙන්නේ. අනෙක් පැත්තෙන් සෑම නියෝජිතයෙක්ම බැලුවොත් බහුතර නියෝජිත සංඛ්‍යාවක් පාරක තොටක ගෑණු ළමයෙක් ගියොත් අරගෙන ගිහිල්ලා දූෂණය කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ගුරු මහත්වරුන්ගේ සේවා තෘප්තිය ගැන කථා කරන්න ඉස්සෙල්ලා මම හිතන්නේ, අපට ඊට වැඩිය හුඟක් දේවල් ගැන කථා කරන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ දැඩි අවධානය යොමු කරනවා. මොකද, එතුමා වසර ගණනාවක ඉඳලා තුන්වැනි පළාත් සභාවේ, හතර වැනි පළාත් සභාවේ ඉඳලා අපත් එක්ක සහ සම්බන්ධ වෙලා කටයුතු කරන්න පුළුවන් අමාත්‍යවරයෙක් හැටියට මම දකිනවා.

ඒ වාගේම එතුමාගේ අවංක උත්සාහයක් තිබෙනවා මේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ යම් දෙයක් කිරීමට. ඒ උවමනාව හැකියාව එතුමාට තිබෙනවා. මොකද, මම අද එක්සත් ජාතික පක්ෂය නියෝජනය කළත්, ඒ කරන කටයුතුවලදී හරි දේට හරි කියන ලක්ෂණය මා ළඟ එදා ඉඳලාම තිබුණා. ඒ නිසා මම කාටවත් සුදු හුණු ගානවා නොවෙයි. මම ඉල්ලීමක් කරනවා, ඒ තමයි අද අපි මේ සේවා පහසුකම් දෙන්න, එහෙමත් නැත්නම් ගුරුවරුන් පුහුණු කිරීම් ගැන කථා කරනවා. මම දකිනවා, මේ බස්නාහිර පළාත් සභාව තුළ ඒ වාගේම අත්තනගල්ල මැතිවරණ කොට්ඨාශය තුළ සමහර පත්වීම් දීලා තිබෙනවා, ඒ ගුරු මහත්මීන්ට බස් තුන හතරේ යන්න වෙලා තිබෙනවා. 7.30 ට තමුන්ගේ රාජකාරී කරන්න අඩුම ගාණේ පැය දෙකකට කලින් ගෙදරින් පිටත් වෙලා යන්න ඕනෑ. මම හිතන්නේ, අපි කොතෙක් උත්සාහ කළත් වැඩක් නැහැ. ඒ වාගේ කිලෝමීටර් 40 ක 50 ක දුර යන්න වෙනවා. තවමත් ගම්පහ දිස්ත්‍රික්කයේ බස් රථ නැති දුෂ්කර ගම්මාන තිබෙනවා. ඉතින් මේ

ගුරුවරුන් යන්නේ අන්න ඒ ආකාරයට තමන්ගේ සේවා සපයන්න. මෙතැනදී අපි මේ ගුරු සේවයේ අය ගැන විතරක් නොවෙයි. අපි දන්නවා මේ උපාධිධාරීන්ට පසුගිය කාල සීමාව තුළදී සැලකුවේ කොහොමද කියන එක පිළිබඳව. රැකියා දීම හරි. රුපියල් 10000/- ක වැටුපකට මේ අය ස්ථාපනය කරපු එක හරි. ඒ ගැන කිසිම ගැටළුවක් නැහැ. නමුත් අදටත් ඒ අයට තමුන්ගේ රාජකාරිය කරන්න පහසුකම් නැතුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එළියේ ගස් යට ඉඳගෙන කටයුතු කරනවා අපි දැකලා තිබෙනවා. ඒ නිසා අපි දැක්කා පසුගිය මැතිවරණවලදී මේ උපාධිධාරීන් මේ දේශපාලනය ක්‍රියාත්මක කළේ, කොහොමද කියන එක පිළිබඳව.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

54,000 කට එක පාර දුන්නේ.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

පළාත් සභා මැතිවරණයේදී එහෙම නැත්නම් පාර්ලිමේන්තු මැතිවරණයේදී, ජනාධිපතිවරණයේදී මේ හැම මැතිවරණයකදීම මේ අය –

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමන්ලා එක රස්සාවක් දුන්නේ නැහැ.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

මැතිවරණ ව්‍යාපාරය සඳහා යොදා ගත්තා. එක්සත් ජනතා නිදහස් සන්ධානය හැටියට. කඩේ යැවිලි හැම එකක්ම කරලා තමයි උපාධිධාරීන් හැටියට රැකියා ලබා දුන්නේ කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තිබෙන යුගයේදී අපි මේ විධියට කටයුතු කරලා නැහැ. උපාධිධාරීන් විශ්ව විද්‍යාලයෙන් ඉවත් වනකොට ඒ අයට රැකියා වැඩ සටහන් සලසා දුන්නා. මේ ආකාරයට –

[සභාවේ ඝෝෂා]

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

එක රස්සාවක් දුන්නේ නැහැ.

**ගරු යූ.පී. චන්ද්‍රසෝම සරණලාල්**
Hon. U.P. Chandrasoma Saranalal

දේශපාලන වැඩ පිළිවෙළවල් අපි සකස් කළේ නැහැයි කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට මම ස්තුතිවන්ත වෙනවා.

[ අ.භා. 12.25 ]

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ගමේ ගොඩේ කථා වෙනවා, කබ්බෝ ෆෝම් කරනවා කියලා කථාවක්.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

දැන් ඔය නැගිටලා ඉන්නෙත් කබ්බෙක් තමයි. ෆෝම් වෙලා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ඉතින් ඒ නිසා මට මේ කථාව පටන් ගන්කොටම මේ සභාවේ අපේ ගරු මන්ත්‍රීවරුන්ට කබ්බා කියන එක හරි නැහැ. අපි එහෙම කියන්නේ කෙනෙකුට අනවශ්‍ය වටිනාකමක් දීලා නිකම් චරිත හදන්න ඕනෑ නැහැ. විපක්ෂයේ මහා හඬක් වාගේ එන සමහර ඝෝෂාවල් අර්ථ සම්පන්න නම්, ඒ කියන වචනය තුළ ඔහුට පිහිටන්න පුළුවන් නම් අපේ ගමේ ගොඩේ විධියට අපි මිනිහාට පොරක් කියනවා. ඒ පොරක් කියන්න බැරි කෙනෙකුත් අපි ඒ මට්ටමේ තියනවා නම් ඒකා කබ්බෙක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පළාත් සභාවේ ක්‍රියාවලිය අප දැකලා තිබෙන විධියට, විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ අපි කවුරුත් අධීක්ෂණ මන්ත්‍රීවරු. අපට දීලා තිබෙන්නේ පළාත් සභා මන්ත්‍රීකම තමයි. ඇත්ත. අපි කවුරුත් පාසලේ අඩුපාඩු දකින, පාසලේ අඩුපාඩු නිරීක්ෂණය කරන පාසල තුළට ගිහිල්ලා ඒ තුළ තිබෙන අඩුපාඩු යම් ප්‍රමාණයකින් විවේචනාත්මකව දකින්න හෝ සම්පූර්ණ කරන්න උදව් කරන්න, යම් අධීක්ෂණයක යෙදෙන්න අපට ඉඩකඩ දීලා තිබෙන්නේ. ඒ නිසා තමයි අපට ව්‍යුහ කමිටු හදලා දීලා, ව්‍යුහ කමිටු තුළ ක්‍රියාත්මක වෙන්න ඉඩ දීලා අපට යම් තීන්දු තීරණ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු, කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරු, අධ්‍යාපන විෂයය භාර අධ්‍යක්ෂවරු ඒ වාගේම වෘත්තීය සමිති නියෝජිතයන් පක්ෂ විපක්ෂ භේදයෙන් තොරව සියලු දෙනාට එකට කැළඹිලා, කැලතිලා තීන්දු ගන්න ඉඩකඩ දීලා තිබෙනවා. එතැනට යන මන්ත්‍රීවරයා ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා නැහැ. ඔහු චරිතයක්. මම මුලින් කිව්වා වාගේ ගමේ ගොඩේ විධියට පොරක්. ඒක දරන්න බැරි සමහර කබ්බන් ඒක විවේචනය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ මේ විවාදය යන අතරතුර ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමා මෙතැන විවේචනයක් කළා අපේ ගරු මන්ත්‍රීවරු සහ ආණ්ඩු පක්ෂය ගන්නා වූ සමහර තීන්දු සම්බන්ධයෙන්.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

පොරකද්ද? කබ්බෙක්ද?

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ඒක අපට හිතා ගන්න පුළුවන් මගේ කථාවේ මුල් ටික ගැන පොඩ්ඩක් හිතුවොත්. කෙසේ හෝ ගරු මන්ත්‍රීවරු හැටියට අපි සියලු දෙනාට වගකීම තිබෙනවා අපි යම් අඩුපාඩුවක් දකිනවා නම්, ඒ අඩුපාඩුව කථා කරන්න තැනක් තිබෙනවා. එක්කෝ කොට්ඨාශ විදුහල්පති රැස්වීම. එහෙම නැත්නම් ව්‍යුහ කමිටු රැස්වීම. මෙවැනි දේවල්වලට. එහෙම නැත්නම් අධ්‍යාපන උපදේශක කාරක සභාවට. එතුමා නියෝජනය කරන මීගමු කලාපයේ ඒ ව්‍යුහ කමිටුවට මා සහභාගී නොවුණත්, මම හැකි සෑම වෙලාවකම අධ්‍යාපන උපදේශක කාරක සභාවට සහභාගී වෙනවා. මේ කොතැනකවත් මා එතුමාව දැකලා නැහැ. හැබැයි එතුමා අධ්‍යාපනය ගැන කථා කරන්නේ මෙතැනට ඇවිල්ලා. මෙතැනදී අධ්‍යාපනය ගැන කථා කරන්න එතුමාට තිබෙන්නේ පෞද්ගලික ද්වේශයක් පමණයි. ඒක හුදු තමන්ගේ කොට්ඨාශය තුළ තිබෙන මේ මනාප ඡන්ද සංඛ්‍යාව පිළිබඳ ප්‍රශ්නයක් විතරයි. ඒ හැරෙන්න එහි හතර කොණ දන්න කෙනෙක් හෝ අඩුම ගණනේ ජා-ඇළ අධ්‍යාපනය ගැන දැන ගන්න ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය හදාරලා තිබෙන්න ඕනෑ. එහෙම දෙයක් එතැන තිබුණේ නැහැ. ඒ නිසා මා ඉතාමත් පිළිකුල් සහගතව එම අදහස බැහැර කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එය හුදු පෞද්ගලික වෛරයෙන් ඉදිරිපත් කළ දෙයක් පමණයි. අධ්‍යාපනය වෙනුවෙන් කැප වෙන්න අධ්‍යාපනඥයෝ අවශ්‍ය නැහැ. මේ රටේ සාමාන්‍ය පෙළ සමත් වුණු අයට මහාචාර්ය උපාධි ලැබිලා තිබෙනවා. මහාචාර්ය කුලසිංහ මැතිතුමා. එතුමා භාවිතය තුළයි, එතුමාගේ වැඩ කටයුතුවල යෙදුණේ. ඒ නිසා තමන්ගේ දේශපාලන භාවිතය යම් කෙනෙක් ඉතාමත් යහපත් ලෙස යම් විෂයය ධාරාවක් වෙනුවෙන් ඒ විෂයය ධාරාවේ උන්නතියට කැපවීම් කරනවා නම්, ඒ කැපවීම් කරන පුද්ගලයා ඒ තුළ බැබලෙනවා. ඒක වළක්වන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ඉතාමත් සත්සිතින් මේ ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් දෙයක් තිබෙනවා. මෙතැන ගරු මන්ත්‍රීවරු කථා කරනකොට උපාධිධාරී ගුරුවරුන්ට යම් පුහුණුවක් ලබා දිය යුතුයි. යම් විෂයය පථයක් තුළ යම් නිපුණතාවයක් ලබා දිය යුතුයි කියලා කථා කළා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ නිපුණතාවය, පුහුණුව ලබා දෙන්න පෙර මේ ගුරුවරුන්ට අපි හොයලා දෙන්න ඕනෑ, අපේ ගුරු දෙව්වරු ගැන. මා හිතන්නේ, අපි අපහසුතාවයට පත් වෙන්නේ මේ ගුරුවරුන්ට පත්වීම් ලබා දීම තුළ නොවෙයි. ස්ථානගත කිරීම් තුළ. ඔවුන් අද හිතන මට්ටම. අද ඔවුන්ගේ වෘත්තීය තත්ත්වය. වෘත්තීය වටිනාකම. ඒ පූජනීය, වන්දනීය රැකියාව ලබා ගැනීමේදී අද ගුරුවරු තමන්ගේ කලාපය ඉල්ලලා, කලාපය තුළ කොට්ඨාශය ඉල්ලලා, කොට්ඨාශය තුළ තමන්ට ආසන්න පාසල් ඉල්ලනවා. සමහර ගුරුවරු ඉල්ලන ඉල්ලීම් බලනකොට තමන් පදිංචි කොට්ඨාශයේ පාසල දෙන්න බැරි නම්, සමහර වෙලාවට දේශපාලන අධිකාරියට නොකියා කියනවා ගේ ළඟ පාසලක් හදලා දෙන්නය කියලා. ඒ මට්ටමට අද ගුරුවරු ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා අපි ඒ අතීත ගුරු දෙව්වරු සොයාගෙන යන්න වෙනවා. ඒ චරිත අධ්‍යයනය කරන්න වෙනවා. ඒ චරිතවල තිබුණු ගුණාත්මක ලක්ෂණ උපාධිධාරී ගුරුවරුන්ට ලබා දෙන්න වෙනවා. ඒ නිසා මම මුලින්ම ඉල්ලා සිටිනවා, ගුරු වෘත්තියේ වටිනාකම, එහි තිබෙන පූජනීයත්වයේ වටිනාකම, එහි තිබෙන අර්ථ සම්පන්න බව ඒ ගුරුවරුන්ට කාවැද්දිය යුතුයි. මා හිතන්නේ විෂයය දැනුමට පෙර අන්න ඒ මානවවාදී ගුණය ඔවුන්ට හුරු පුරුදු කළ යුතුයි කියලා. ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව සංශෝධනය වීමට පෙර තිබුණේ උපාධිධාරියාගේ විෂයයට අදාළව පන්තිය භාර දෙන්න කියලා. විෂයය භාර දෙන්න කියලා. හැබැයි ගැටළුවක් තිබෙනවා. අද වෙද්දී උසස් අධ්‍යාපන බලධාරීන් යම් යම් ප්‍රමාණවලින් උත්සාහ දරනවා. එය කෙසේ නිවැරැදි වෙයිද කියලා මම විශ්වාස කරන්නේ නැහැ. වෘත්තීය තත්ත්වයන්ට ගැළපෙන ආකාරයෙන් විෂයය දැනුමක් උසස් අධ්‍යාපනයට ලබා දෙන්න. උසස් අධ්‍යාපනය මා හිතන්නේ Technical College නොවෙයි. විශ්ව විද්‍යාල කියලා කියන්නේ, කාර්මික විද්‍යාල නොවෙයි. විශ්ව විද්‍යාල අධ්‍යාපනය ගත්තොත් ඒ විෂයය පථය තුළ විද්‍යාර්ථයෙක් හා නිපුණයෙක් නිර්මාණය කළ යුතුයි. ඒ විද්‍යාර්ථයා නැවත වාරයක් ආවාම අපි භාර දෙන්නේ ප්‍රාථමික අධ්‍යාපනය නම්, ප්‍රාථමික අධ්‍යාපනය භාර දෙනකොට ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ උපාධියක් කරලා එන්න වෙනවා. අද උපාධිධාරීන් බිහි වෙන්නේ 1% යි, 2% යි. මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන්. ඒ බිහි වන 1%, 2% වෙනුවෙන් ඒ 1%, 2% දැනුමට පාසල් අධ්‍යාපනයෙන් විෂයය පථය හදනවාද? එහෙම නැත්නම් ඒ පාසල් අධ්‍යාපනය විෂයය පථයට අදාළව උපාධිධාරියා හදනකල් තිබෙන ගැටළුව තිබෙනවා. මේ උභතෝකෝටිකය විසඳා ගැනීමට තිබෙන ආසන්නම දේ තමයි මූලික සුදුසුකම උපාධිය සේ සලකලා ඒ උපාධිධාරියා නැවත වාරයක් විෂයය දැනුමෙන් සම්පූර්ණ කරන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි කවුරුත් උපාධිධාරීන් සාමාන්‍ය පෙළ වෙනකල්ම ඔය කියන සමාජ අධ්‍යයනය, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාලව, ශාරීරික අධ්‍යාපනය සියල්ල හදාරලා යනවා වෙන්න පුළුවන්. උසස් පෙළේදී ඔවුන් එක් විෂයය පථයකට විතරක් සීමා වෙනවා. උපාධියට ගියාම තවත් විෂයය පථයකට පමණක් සීමා වෙනවා. ඒ නිසා ඔහු නැවත පිරිපහදු කරලා අපට ගන්න බැහැ ප්‍රාථමික අධ්‍යාපනයට හෝ ද්විතීයික අධ්‍යාපනයට. ඒ පිරිපහදු කිරීම කළ හැකි වන්නේ අනිවාර්යයෙන්ම අභ්‍යාසලාභී මට්ටමේ පත්වීමක් හරහා හෝ එහෙම නැත්නම් ගුරු පත්වීම් ලබා දීලා අදාළ අභ්‍යාසයන් සඳහා ඔවුන් නිරත කිරීම තුළින්. අපේ නවක මන්ත්‍රීතුමා, මම හිතන්නේ ජ්‍යෙෂ්ට මන්ත්‍රීතුමෙක්. එතුමා සභාවට ඇවිල්ලා කිව්වා මේ උපාධිධාරීන්ට පත්වීම් ලබා දීම සම්බන්ධයෙන්. එතුමන්ලාගෙන් ගිලිහුණේ එක සටන් පාඨයක්. හැබැයි 50,000 කගේ බඩගින්න නිවුණා. ඔවුන්ගේ වේදනවා තිබෙන්නේ, සටන් පාඨයක් ගිලිහීම පමණයි. උපාධිධාරීන්ට

රැකියා දියව්. උපාධිධාරීන්ට රැකියා ලැබිලා නැහැ. උපාධිධාරීන් මහ පාරේ කියමින් හඬ නගන්න තිබුණු අවස්ථාව මහින්ද චින්තන වැඩ පිළිවෙළ තුළ නැති වෙලා තිබෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ පත්වීම් ලබා දීම තුළ බලාපොරොත්තු ඉෂ්ට සිද්ධ කරලා තිබෙනවා. හැබැයි, එවැනි විශාල සංඛ්‍යාවක් වෘත්තීය ක්ෂේත්‍රයට පැමිණෙනකොට යම් අසංවිධිත බවක් තිබිය හැකියි. ඒ අසංවිධිත බව තිබෙන නිසා තමයි යම් යම් ප්‍රමාණවලින් අභ්‍යාසලාභී පත්වීම් ලබා දෙන්නේ. ඒ අභ්‍යාසලාභී පත්වීම් ලබා දීම තුළ හෝ රැකියා විරහිතභාවය හා අපේ ශ්‍රම බලකායට උපාධිධාරීන්ට එයින් බැහැර වෙන්න නොදී ඔවුන් මේ ජාතික ධනයෙන් අධ්‍යාපනය හදාරපු ජන කොටස හැටියට ඒ ශිෂ්‍ය පිරිස උපාධිධාරීන් හැටියට මේ රැකියා ප්‍රවාහයට ඇතුල් කර ගන්න උත්සාහ දරලා තිබෙන්නේ. එම නිසා අඩුපාඩු තිබුණත් මම හිතන්නේ, දිගන් දිගටම එය සිද්ධ කළ යුතුයි. උපාධිධාරීන්ට රැකියා අවස්ථා ලබා දිය යුතුයි. ඒ නිසා මා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ යෝජනාව කාලෝචිත යෝජනාවක්. ඒ කාලෝචිත යෝජනාව පණ ගන්වන්න හැකියාව මධ්‍යම රජයේ සහ පළාත් සභා සියලු බලධාරීන්ට හැකියාව ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම වඩා විධිමත් අධ්‍යාපනයක් ලබා දීමේ පරමාර්ථයෙන් ක්‍රියාත්මක වන මේ පළාත් සභා පාසල් ව්‍යුහය තුළ වඩා විධිමත් ආකාරයට මේ යෝජනාව ස්ථාපිත කිරීමේ හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

[ අ.භා. 12.34 ]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධයෙන් මම හිතන්නේ රටේ අධ්‍යාපනය දියුණු කරන්න එහෙම නැත්නම් අපේ රටේ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් ගෙන එන සුභවාදී, සාධනීය කවර හෝ යෝජනාවකට අපි අපේ පූර්ණ එකඟතාවය, පක්ෂපාතීත්වය පළ කරනවා. කොහොම වුණත් මේ යෝජනාවේ සඳහන් වන ගුරුවරුන්ට ඒ ඒ විෂයයන් සඳහා විශේෂ පුහුණුවක් ලබා දීම කියන එක මේ වනකොටත් අධ්‍යාපන උපදේශක කාරක සභාව නියෝජනය කරන අපේ සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා විසින් යෝජනාවක් විධියට ගෙනැල්ලා යම් වැඩ පිළිවෙළක් අධ්‍යාපන ඇමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සකස් කරලා තිබෙනවා. ඉතින් ඒ වාගේම මම කථාව ආරම්භයේදීම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට මතක් කරන්න කැමැතියි මේ අධීක්ෂණ මන්ත්‍රීවරු රටට පිළිලයක් වෙමින් යන්නේ. තමුන්නාන්සේ නිල වශයෙන් තමුන්නාන්සේගේ ප්‍රකාශය අපේ විදුහල්පතිවරුන් සහ විශේෂයෙන් මාධ්‍ය හරහා රට දැනුවත් කළොත් හොඳයි. මෙහෙම මේ අධීක්ෂණ මන්ත්‍රීකම් කියලා පට්ටම් නැහැ කියලා. ඒ මොකද, මේ අධීක්ෂණ භාදයෝ තමයි රට අවුල් කරන්නේ. දැන් බලන්න ආරක්ෂක අමාත්‍යාංශයේ [ ගරු නලින්ද ජයතිස්ස ]

අධීක්ෂණ මන්ත්‍රී මහ දවාලේ මිනී මරනවා. අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී මහ දවාලේ ගුරුවරු දණගස්සනවා. ඒ නිසා මේ අධීක්ෂණ පට්ටම් පාවිච්චි කර කර, තමුන්නාන්සේගේ ආණ්ඩුවත් පක්ෂයත් අපහසුතාවයට පත් කරන තැන තමයි මේ භාදයෝ ඉන්නේ. ඒ නිසා තමුන්නාන්සේගේ ප්‍රකාශය පළාත් සභාවට විතරක් නොවෙයි. මේ රටේ විදුහල්පතිවරුන්, ගුරුවරුන්ට සහ රටට දැන ගන්නත් ප්‍රසිද්ධ කළොත් හොඳයි කියලා මම යෝජනා කරනවා. ඒ වාගේම මේ ගුරු පරපුර තෘප්තිමත් කිරීම සඳහා සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාවේ ප්‍රධාන කරුණු තුනක් තිබෙනවා. එක, ගුරුවරුන්ට අවශ්‍ය කරන අගය කිරීම් ලබා දීම. දෙක, ඔවුන්ට Promotion සඳහා අවශ්‍ය කරන බාධා ඉවත් කිරීම. තුන්වැනි කාරණය විධියට උපාධියට එහෙම නැත්නම් විශේෂ පුහුණුවක් ලබා දීම.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේකේ එතුමා දැනුවත්ව හෝ නොදැනුවත්ව අත් හරින ලද කාරණාවක් තිබෙනවා. ඒ තමයි ගුරු පරපුර තෘප්තිමත් කරන්න නම් ඔවුන්ට අවශ්‍ය කරන ප්‍රමාණවත් වැටුප් වැඩිවීමක් තිබෙන්න ඕනෑ. වැටුප් වැඩිවීමක් නැතුව කවුරුත් තෘප්තිමත් කරන්න බැහැ. මීට සති දෙකකට ඉස්සරවෙලා පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අහපු එකක් සහ අදාළ ඇමැතිවරු උත්තර දීපු එකක් මම මේ අවස්ථාවේ කියන්න කැමැතියි. එතැනදී ඇහුවා, ශ්‍රී ලංකන් එයාර් ලයින් එකේ සභාපතිතුමාගේ අධ්‍යාපන සුදුසුකම් මොනවාද කියලා. අදාළ ඇමැතිවරයා උත්තර දෙනවා සාමාන්‍ය පෙළ දක්වා. සමත් නැහැ. සාමාන්‍ය පෙළ දක්වා තමයි තිබෙන්නේ. ඊළඟට ඇහුවා එතුමාගේ වැටුප කීයද? වැටුප් ගන්නේ නැත. ඊළඟට ඇහුවා දීමනා කවරේද? ඔහු රුපියල් ලක්ෂ 2 1/2 ක දීමනාවක් ගනී. දැන් බලන්න සාමාන්‍ය පෙළ දක්වා ඉගෙන ගත්තු, සාමාන්‍ය පෙළ සමත් නැති පුද්ගලයෙකුට රටේ තිබෙන වැදගත්ම ආයතනයක් භාර දීලා, රුපියල් ලක්ෂ 2 1/2 ක දීමනාවක් දෙනවා. කවුද මේ සභාපතිතුමා? නිශාන්ත වික්‍රමසිංහ මහත්මයා. අපේ රටේ පළමුවැනි පුරවැසියාගේ මස්සිනා. අපේ රටේ පළමුවැනි පුරවැසි කාන්තාවගේ අයියා. දැන් බලන්න අපේ රටේ මේ අනාගතය හදන්න ඉන්න ගුරුවරුන්ට වැටුප් වැඩි කරන්නේ නැහැ. ඔවුන් තෘප්තියට පත් කිරීම සඳහා ඔවුන්ගේ අතට වැඩි වැටුපක් දෙනවා වෙනුවට මෙන්න මේ වාගේ - ඕක තමයි කබ්බෝ ෆෝම් කරනවා කියන්නේ. මේ කබ්බෝ රට විනාශ කරනවා. මේ තමයි සැබෑ කබ්බෝ. රට කනවා. කෝටි 2050 යි ගිය අවුරුද්දේ පාඩුව. ඉතින් O/L වත් පාස් නැති භාදයෙක් ශ්‍රී ලංකන් එයාර් ලයින් එක කරන කොට කෝටි 2050 ක් පාඩු නොවී තියෙයිද? පාඩුයි තමයි. ඒ නිසා මේ යෝජනාවට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,

සංශෝධනයක් විධියට ගෙනාවා නම් හොඳයි අපේ රටේ *සිප්කිරි පෙවූ මුසිලයන් උඩු මහලේ - අපෙ ගුරුතුමා යයි තාමත් මහ පාරේ - ඉස්කෝලේ* කියලා නේ තිබෙන්නේ. සිප්කිරි පෙවූ මුසලයෝ, මුසිලයෝ නොවෙයි. මූසලයෝ රට කන තැන්වල තියලා මේ ගුරුවරු මහා පාරේ යවන්නයි, ගුරුවරු දණ ගස්සන්නයි නොවෙයි, මේ ගුරුවරු තෘප්තියට පත් කරන්න නම් අනිවාර්යයෙන්ම ගුරුවරයාට තිබෙන සමාජ පිළිගැනීම දෙන්න ඕනෑ. ඒගොල්ලන්ට තිබෙන උසස්වීම්වලට, ඒගොල්ලන්ට තිබෙන තනතුරුවල දේශපාලනය ඇහිලි ගහලා හරි යන්නේ නැහැ. ඒ වාගේම මේ පුහුණුව විතරක් නොවෙයි. පුහුණුවට අමතරව ඒ අයට ප්‍රමාණවත් වැටුප් වැඩිවීමකුත් දෙන්න ඕනෑ. එය අනිවාර්යයයි. එහෙම නැතුව මේ කවර යෝජනා කළත් අපි මොන සම්මාන දුන්නත්, මොන අගය කිරීම් කළත් (බාධා කිරීමක්) මොකක්ද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

වැව් අධීක්ෂණ මන්ත්‍රී.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

වැව් අධීක්ෂණ මන්ත්‍රීලා. නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කිරි ගම්මාන අධීක්ෂණ මන්ත්‍රීලා.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

එහෙම තිබුණේ නැහැ. සිනී අධීක්ෂණ මන්ත්‍රී වාගේද?

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

කරුණාකරලා ඔබතුමා මූලාසනයට කථා කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපනය දියුණු කරන්න ගෙන එන ඕනෑම යෝජනාවකට අපි ඉතසිතින් සහාය දෙනවා. මේ යෝජනාවටත් අපි මේ එකතු කිරීමක් කරන්නේ මේ රටේ අධ්‍යාපනය විනාශ කරන්න කිසිම කෙනෙකුට දෙන්න බැහැ. ඒක පළාත් සභාවෙන් හරි, මධ්‍යම ආණ්ඩුවෙන් හරි කරන කවර හෝ දෙයක් තිබෙනවා නම් එයට සහාය දෙන බව කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා ඔබතුමාගේ ආසනයට යන්න. මීළඟට ගරු ප්‍රධාන අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[ අ.භා. 12.39 ]

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාව ගේන කොට මම බලාපොරොත්තු වුණේ නැහැ, අදහස් ප්‍රකාශ කිරීමක් කරන්න. මට ඕනෑ වුණේ, මන්ත්‍රීවරුන්ගේ අදහස් ටික අරගෙන අද ක්‍රියාත්මක ක්‍රමයට වඩා දියුණු ක්‍රමයකට යොමු වීමටයි. ඒ නිසා මේකේ වෙනසක් ඇති කළ යුතු නම්, ඒක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය යෝජනා සභාවට ගෙනෙයි කියලා මම බලාපොරොත්තු වුණා. නමුත් මේ සම්බන්ධව කථා කළ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ මම කල්පනා කළා, මාධ්‍ය ඉන්න නිසා මේ පිළිබඳව නිවැරදි කිරීමක් කරන්න ඕනෑය කියලා. මොකද, එතුමාගේ කථාවේදී ප්‍රකාශ වුණා, ප්‍රමාණවත් උපාධිධාරීන් විෂයයන්වලට නැති හින්දයි මේ යෝජනාව සංශෝධනය කළේ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ පළාත් සභාවේ 2008 ගුරු විභාගය පවත්වලා එදා 80 ට වැඩි - විෂයයන් දෙකට 40 ට වැඩිය ගත්ත සියලු දෙනාටම ගුරු පත්වීම් ලබා දෙන්න කටයුතු කළා. ඒ දෙන කොට විෂය අනුව පත්වීම් ලබා දීලා, කලා උපාධියේ ප්‍රාථමික අංශයේ පත්වීම් ලබා දීලා, ඊළඟට අනික් විෂයන්වල ඉහළ ලකුණු ගත්ත අයටත් අපි පත්වීම් ලබා දෙන්න කටයුතු කළා. ඒ දෙන කොට තුන එක ශ්‍රේණියේ ගුරු පත්වීමක් අපි ලබා දුන්නේ, ඒ උපාධිය හදාරපු ළමයින්ගේ ඉල්ලීම පරිදි. මේ උපාධිය බස්නාහිර පළාතේ පවත්වන්නේ. අපේ පුරප්පාඩුවලට වඩා වැඩි ප්‍රමාණයක් උපාධිධාරීන් ඉන්න නිසා ඒ අය තෝරා ගන්න කටයුතු කළා. එකම විභාගයක් හැම විෂයයටම තිබෙන්නේ. ඒ නිසා මම විශ්වාස කරනවා. කලා උපාධියේ අඩු මට්ටමට යනවාට වඩා විද්‍යා, ගණිත උපාධිවල ඉහළ මට්ටම්වල ඉන්න දරුවෝ අපේ මේ කාර්යභාරය කරන්න වඩා ප්‍රයෝජනවත් බව. ඒ නිසා අපි 2008 දී ඒ කටයුත්ත ඒ ආකාරයෙන් කළා. 2011 දීත් අපි විභාගය පවත්වන කොට යම් යම් සංශෝධන කළා. චන්ද්‍රසෝම සරණලාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි පිළිගන්නවා. අපි ගුරු පත්වීම් දෙන කොට යම් කාල සීමාවක් ඒ ගුරුවරුන්ට බස්නාහිර පළාත තුළ දුෂ්කර සේවා රාජකාරී සිදු කරන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒක පෙර කාලයේ සිට ඇති වුණු දෙයක්. 2005 දී පත්වීම් ලබලා අදටත් තවම ගම්වලට යන්න බැරිව ඉන්න ගුරුවරුන්ට ඒ අවස්ථාව දෙන්න ඕනෑ හින්දා තමයි ඒ අලුතෙන් බඳවා ගන්න ගුරුවරුන්ට ඒ තැන්වලට යන්නට දීලා මේ අයට ඒ අවස්ථාව ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඊළඟ ගුරු විභාගය තියන කොට කලාප මට්ටමින් ලකුණු දීලා බඳවා ගන්න. ඒ අනුව ගුරුවරුන්ට ඒ කලාපය තුළ, තමන් කැමැති කලාපය තුළ ඇති වන පුරප්පාඩුවලට ඒ ලකුණු මට්ටම අනුව යන්න පුළුවන් ආකාරයට සකස් කරන්න දැන් මේ වන

කොට අපි සාකච්ඡා කරනවා. මම හිතනවා, ඒක වඩාත් ප්‍රයෝජනවත් වෙයි කියලා. ඒ පිළිබඳව යෝජනාව කථා කළායින් පස්සේ අපි බලාපොරොත්තු වෙනවා, උපදේශක කාරක සභාවට දාලා, මේ සම්බන්ධව සාකච්ඡා කරලා තීන්දුවක් ගන්න.

අනික් එක මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පැහැදිලිවම අපි අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කරලා නැහැ. අපි ව්‍යූහ කමිටු පත් කරලා, සියලුම දේශපාලන පක්ෂ නියෝජිතයන්ට එතැනට සම්බන්ධ වෙන්නය කියලා, නිලධාරීන්ට සම්බන්ධ වෙන්නය කියලා, වෘත්තීය සමිතිවලට සම්බන්ධ වෙන්නය කියලා ඒ කලාපය තුළ තිබෙන ගැටළු පිළිබඳව සාකච්ඡා කරන්න අවස්ථාව උදා කරලා දීලා තිබෙනවා. ඒ තුළ වඩා නිවැරදි, වඩා හොඳ තීන්දු එන නිසා එය ක්‍රියාත්මක කිරීමේදී හොඳ ප්‍රතිඵල ගන්න පුළුවන් කියන විශ්වාසය තුළ තමයි එහෙම අවස්ථාව උදාකර දී තිබෙන්නේ. නමුත් මම හිතන්නේ, ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා වැස්ස වෙලාවකටවත් අඩු ගණනේ එහෙම සමිතියකට, ව්‍යූහ කමිටුවට ගිහිල්ලා නැතිව ඇති. එහෙම ගියා නම් ඔය වාගේ කථාවක් එතුමා කරන්නේ නැහැ. එතුමාගේ කථාව පිළිබඳව මම මෙතැන ඉඳන් වාඩි වෙලා කල්පනා කළේ, ගුරු සාකච්ඡා, ගුරුවරු සම්බන්ධව විදුහල්පති රැස්වීම් තිබෙද්දී මෙතුමාගේ කථාව ඉස්සෙල්ලාම දාන්න. එහෙම දැම්මා නම්, එතුමාගේ මානසිකත්වය ගැන විදුහල්පතිවරු දැන ගන්නවා. හැබැයි ඊළඟට මට ආයිත් හිතුණා. එහෙම දැම්මොත් හොඳ නැහැ. මොකද, ඒක සමස්ත පළාත් සභාවට හොඳ නැති හින්දා. ඒකත් කියන්න එපැයි. ඒ නිසා කොහොම වුණත් මම හිතන්නේ එතුමා මෙතැන හිටියා නම් හොඳයි. මම බලාපොරොත්තු වුණා, එතුමා මගේ කථාව වන කොටවත් ඉදියි කියලා. සාමාන්‍යයෙන් යමක් ප්‍රකාශ කළොත් ඒ අභියෝගයට මුහුණ දෙන්න ඉන්න ඕනෑ. නිවටයෝ තමයි පැනලා යන්නේ. මේ කථාව හැන්සාඩ් ගත වන නිසා එතුමා බලයි. ඒ නිසා එතුමාට ඔයිට වඩා ප්‍රයෝජනවත් කථාවක් කළා නම් හොඳයි. මොකද, සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා. මෙතුමා කියපු හින්දා - එතුමන්ලා දන්නවා. අපි උපදේශක කාරක සභා හසුරුවන්නේ කොහොමද කියලා. මේ මගේ දෙයක් නොවෙයි. එතුමන්ලා ගේන දේ තමයි මම ක්‍රියාත්මක කරන්නේ. ඒකේ අවසාන ප්‍රතිඵලය හොඳ හෝ නරක එන්නේ මට. අද වන තෙක් මේකේ යම්කිසි හොඳක් ඇහුවා නම් ඒ මන්ත්‍රීවරු සියලු දෙනාගේම එකමුතුකමේ ප්‍රතිඵලයක් හැටියට තමයි මම මේක දකින්නේ. මෙතැන කථා කරන්න හදපු හැමෝම කථා කරන්න හැදුවේ මේ ගුරුවරුන්ට. මේක අපට අමතක කරන්න බැහැ. උපාධිධාරීන්ට මේ රටේ හැමදාම සැලකුවේ පොදු ජන එක්සත් පෙරමුණු රජයක් යටතේ. හැමදාම වැඩිම පත්වීම් ලබා දුන්නේ පොදු ජන එක්සත් පෙරමුණ රජයක් යටතේ. ඊයේ පෙරෙයිදා දුන්න පත්වීම් ප්‍රමාණය අති විශාලයි. උපාධිධාරීන් 45,000 කට පත් වීම් දුන්නා. එය රු. 10,000/- වැටුපෙන් ආරම්භය වෙන්න පුළුවන්. හැබැයි, එදා එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ වාගේ උපාධිය ගත්ත ළමයාව ටයර් සෑයක ඇරියේ නැහැ. රු. 10,000 ක් හරි දීලා පත්වීමක් දුන්නා. ඒ ගැන අගය කිරීමක් කරන්නේ නැහැ. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න. අද ඒ සියලුම උපාධිධාරීන්ට පත්වීම් ලබා දීලා තිබෙනවා. ඒක ඉදිරියටත් ලැබෙමින් යනවා.

ඒ වාගේම දණ ගස්වපු - මගේ මව ගුරුවරියක්. මම කවදාවත් ඒ මට්ටමට පත් වෙනවාට කැමති නැහැ. මේ ඇති වුණු සිද්ධිය

[ ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා ]

මොන පසුබිම තුළ ඇති වුණත් ඒක අපට කවදාවත් සාධාරණීකරණය කරන්න පුළුවන්කමක් ඇති වෙන්නේ නැහැ. ඒ නිසා ජනාධිපතිතුමා පැහැදිලිව නියෝගයක් කළා. එතුමාව ඉවත් කරන්න, මන්ත්‍රී ධූරය අහෝසි කරන්න, ඒ වාගේම ඒ ගුරුවරියගෙන් සමාව ගන්නය කියලා ජනාධිපතිතුමා නියෝග කරලා තිබෙන්නේ. ඒ ප්‍රකාශය නොකළා නම් එහෙම ජනාධිපතිතුමා මේක බලන් හිටියා කියලා කියනවා. ඒක කිව්වාම කියනවා, වාසි ගන්න කිව්වාය කියලා. ඒක එක එක්කෙනාගේ මතය. නමුත් කවුරු කළත් අපි එවැනි සිද්ධි අනුමත කරන්නේ නැහැ. හැබැයි, මේක අමතක කරන්න බැහැ. ඉතිහාසයේ තිබුණා. 1989 - 1991 භීෂණ කාලයේ ගුරු විදුහල්පතිවරුන්ව මරලා, දණිස්සට උඩින් මිනී පෙට්ටිය ගෙනියන්න එපැයි කියපු කාලයකුත් තිබුණා. (බාධා කිරීමක්) යූ.එන්.පී. ය කාලේ. ඒක මම නොවෙයි කියන්න තිබුණේ. ඒක ඔබතුමයි කියන්න තිබුණේ. එහෙම කාලයකුත් තිබුණා. මම හිතන්නේ එක නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමාම කිව්වා නම් තමයි වඩා වටින්නේ. නමුත් විදුහල්පතිවරුන් තුණ්ඩු කැල්ලට පාසල වහන්නේ නැතිව සිටියාම මිනී මරලා, බෙල්ල කපලා ගේට්ටුවේ ගහලා තිබුණු කාලයක් තිබුණා. ඒවා අපි අමතක කරලා, වර්තමානයේ කථා කරන්න බැහැ. මම කියන්නේ නැහැ ඒකත් හරියි කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

71.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මොන අවුරුදුවල හරි. 71 වෙන්න පුළුවන්. 1989, 1991 වෙන්න පුළුවන්. කොයි කාල සීමාවේ වුණත් වැරැද්ද වැරැද්දමයි. ඒ නිසා ගුරුවරුන්ට ඒ ගරුත්වයත් ලබා දෙන්න. විශේෂයෙන් මේ අවස්ථාවේදී රිචඩ් පතිරණ ගරු අමාත්‍යතුමාව මම මතක් කරනවා. ඒ ගුරුවරුන්ගේ වැටුප් වැඩි කරලා, ගුරු ගෞරවය ලබා දෙන්න කටයුතු කළේ එතුමා. ඒ කාල සීමාවේ සිට අද වන තෙක් වර්තමානයේ ගුරු වෘත්තියට - එතුමා කිව්වා වාගේ විශාල වශයෙන් පෞද්ගලික අංශවල ඉහළ රැකියා කරන අය ඇවිල්ලා අද ගුරු සේවයේ රැකියා කරනවා. අද අපේ පද්ධතිය තුළ, ස්වේච්ඡාවෙන් ඊළඟ ලකුණ අරගෙන පත්වීම ලබා ගන්න බලාපොරොත්තුවෙන් ඉන්න අය දෙසීය තුන්සීය හැමදාම රාජකාරියේ යෙදෙනවා. ඒ අයට ගෞරවයක් ලැබෙන්න ඕනෑ.

මම මේ ප්‍රකාශය කරන්නේ, මම ඊයේත් කලා උපාධිවල ලකුණු 96 ගත්ත අයව කැඳවලා, ස්වේච්ඡාවෙන් වැඩ කරන්න කැමැති අයත් එක්ක සාකච්ඡා කරලා එතැනට ආපු 175 කින් විතර 125 ක් කැමැත්ත දීලා තිබෙනවා ස්වේච්ඡාවෙන් වැඩ කරන්න. ඒ උපාධිධාරීන් මෙතෙක් කල් රැකියාවක් නොකර හෝ රැකියාවල් කරලා හෝ සිටියත් ඒ වාගේම වර්තමානයේ අභ්‍යාසලාභී උපාධිධාරී පත්වීම් ලබපු අය පවා කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙනවා, බස්නාහිර පළාතට ඇවිල්ලා මාස තුනක් ස්වේච්ඡාවෙන් ඒ අයගේ සේවය ලබා දෙන්න. ඒ අයට ගෞරවයක් හැටියට සටහන් කළ යුතු නිසා මම ඒක මතක් කළේ.

ඒ නිසා අපි මේ බස්නාහිර පළාතේ ඉන්න ගුරුවරු 33,000 කින් පසුගිය අවුරුදු තුනක කාල සීමාව තුළ ගුරුවරු 6000 කට ආසන්න ප්‍රමාණයකට අපි උපාධිධාරීන්ට පත්වීම් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. අපි ඒ පත්වීම් ලබා දෙනවා වාගේම සරත් පතිරණ ගරු මන්ත්‍රීතුමා උපදේශක කාරක සභාවේ යෝජනාවක් ගෙනැල්ලා අපි ඒ ගුරුවරුන්ට අවශ්‍ය කරන පුහුණුව පවා ලබා දෙන්න කටයුතු කරනවා. අපේ පාසල් පද්ධතිය හරහා. අද එහි ප්‍රතිඵලය තිබෙනවා. මීගමුව වාගේ කලාපයක අධ්‍යාපන මට්ටමින් කඩා වැටිලා තිබුණු කලාපයක ගුරුවරු පුරප්පාඩු සඳහා ගුරුවරු ලබා දීලා අනිකුත් දේ සපයලා ඒ මට්ටම තුළ, විෂය මාලාව තුළ, අධ්‍යාපන ප්‍රතිඵල අද ඉහළ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. අපි ඊයේ පෙරෙයිදා මීගමුව කලාපයේ ප්‍රතිඵල විශ්ලේෂණයක් කරද්දී දුටුවා, මීගමුව කලාපය ඉහළ මට්ටමකට ගෙනැල්ලා තිබෙන බව. ඒ වාගේම කළුතර දිස්ත්‍රික්කයේ මතුගම කලාපය - නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා දන්නවා ඇති. ඒ කාලයේ විශාල ගුරු පුරප්පාඩු ප්‍රමාණයක් තිබුණු පාසල්. අද ගුරු පුරප්පාඩු හිඟය අවම කරන්න කටයුතු කරලා තිබෙනවා. හැම මාසයක් අවසානයේදීම ගුරු පත්වීම් ලබා දෙන්න අපි කටයුතු කර ගෙන යනවා. ඒ නිසා උපාධිධාරීන්ට අවශ්‍ය කරන පුහුණුව ලබා දීලා, ඒ ගුරුවරුන්ගේ වටිනා දැනුම අපේ දරුවන්ට ලබා දෙන්න අපි කටයුතු කර ගෙන යනවා. ඒ වාගේම ඉදිරි කාලයේදීත් ගුරු විභාගය පවත්වන්න කලාප මට්ටමින් අපි කටයුතු කරනවා. මම හිතනවා. ඒ කාරණාව වන කොට අර මන්ත්‍රීතුමා කිව්වා වාගේ දුෂ්කර කලාපවලට, දුෂ්කර සේවයක් කරන්න වෙන ගුරුවරුන්ට ඒ කාලය අවම කර ගන්න පුළුවන් වෙනවා.

මම විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ව්‍යූහ කමිටුව හරහා ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු සම්බන්ධ වෙලා, ඒ අයගේ දායකත්වය ලබා දීලා, පාසල්වල අඩුපාඩු, භෞතික සම්පත් හා මානව සම්පත් ලබා දීම විතරක් නොවෙයි, පුහුණු වැඩ සටහන් පවා අධීක්ෂණය කරන්න ඒ අය කටයුතු කරලා තිබෙනවා. ව්‍යූහ කමිටුවේදී ඒ පිළිබඳ ප්‍රගතිය සාකච්ඡා කරන්න ඒ අය කටයුතු කරලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵල අපට ලැබෙමින් පවතිනවා. ඒ නිසා දරුවන් පාසලට ඇතුළත් කර ගැනීමේදී මම වගකීමෙන් කියනවා. විදුහල්පතිවරයා පත් කිරීම් දෙනවා. සම්මුඛ පරීක්ෂණ තියලා ඒ දරුවන්ව ඇතුළත් කරන්න කටයුතු කරනවා. ඊළඟට 41 සීමාව තුළ ක්‍රියාත්මක සේවාවෙන් බඳවා ගන්නවා. ඒ 41 සීමාව තුළ යම් පුරප්පාඩුවක් ඇති වුණොත් ඒ පුරප්පාඩුවට දරුවන් ඇතුළත් කරන්නේ මම. මමයි නිර්දේශ කරන්නේ. මමයි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමාත් එක්ක කථා කරලා අපට ලැබිලා තිබෙන අභියාචනා සලකලා එය ලබා දෙන ක්‍රමවේදයක් අපි අනුගමනය කරනවා. එතැනදී මහජන නියෝජිතයකුගේ දරුවකු සිටියොත් ඒ දරුවාට ප්‍රමුඛතාවය ලබා දෙන්නත් මම කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා ඕනෑම කෙනෙකුට විවෘතව තමන් කියන දේ - අර මන්ත්‍රීතුමා කිව්වා මෙරිල් ගරු මන්ත්‍රීතුමාගේ 19 ක ලේඛනයක් හැදුවාය කියලා. ලේඛන හදන්න පුළුවන්. ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ මන්ත්‍රීවරු හැමෝම මට ලියුම් එවනවා දරුවෝ ඇතුළත් කරන්නය කියලා. ඒ හැම දෙනාගේම දේවල් සැලකිල්ලට ගන්නවා. අරගෙන වඩා නිවැරදි දේ කරන්න අපි හැම තිස්සේම කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ වාගේ වැදගත් යෝජනාවක් ගේන කොට ඒ යෝජනාව සම්බන්ධව පළාත් සභාවට වටිනාකමක් ඇති වෙන්න, ඒකේ ප්‍රතිඵල ප්‍රයෝජනවත් වන විධියට කතා කළාම මම හිතන්නේ මෙතැනට පැමිණෙන නිලධාරීන්ටත්, තමුන්නාන්සේලාගේ කථාවලට ඇහුම් කන් දීලා උපදේශක කාරක සභා මට්ටමෙන් ඒ අනුව කටයුතු කරන්න පුළුවන්කම තිබෙනවා. කෙසේ වෙතත් සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා ගෙනාපු කාරණාව පිළිබඳව මගේ ස්තුතිය එතුමාට පුද කරමින්, විශේෂයෙන්ම උපාධිධාරී ගුරුවරු සම්බන්ධව කටයුතු කරන්න, පළාත් සභාවක් හැටියට අනෙකුත් පළාත් සභාවලට වඩා වගකීමෙන් මේ වන කොට කටයුතු කරලා තිබෙන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.51 ]

**ගරු සිසිර ජයකොඩි**
Hon. Sisira Jayakody

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාවේ අපි ප්‍රමුඛතම කාරණය ලෙස සඳහන් කර තිබුණේ උපාධිධාරීන් මෙතරම් ප්‍රමාණයක් ගුරු සේවයට බඳවා ගැනීම පිළිබඳව ගෞරවය පිරිනැමීම. විශේෂයෙන්ම එක යුගයකදී උපාධිධාරීන් රාජ්‍ය සේවයට බඳවා නොගන්නා කාල පරිච්ඡේදයක් අපේ ඉතිහාසය තුළ තිබෙද්දී මෙතරම් විශාල ප්‍රමාණයකට ගුරු පත්වීම් ලබා දීම සහ උපාධිධාරීන් රාජ්‍ය සේවයට එක් කිරීම පිළිබඳව අපේ ප්‍රශංසාව මම හිතන්නේ, මේ මුළු සභාවම පිරිනමනවා. කිසිම සැකයක් ඇත්තේ නැහැ.

ඒ වාගේම මේ සාකච්ඡාවේදී විශේෂයෙන් ගුරුවරුන්ගේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම පිළිබඳව අපේ සාකච්ඡාව සිදු වුණත් බොහෝ විට මතු වන කාරණාව වුණේ මන්ත්‍රීවරුන්ගේ ගුණාත්මක භාවය පිරිහීම පිළිබඳව විවාදයක් බවට පරිවර්තනය වීමයි. මම හිතන්නේ සමස්ත සමාජය තුළම ගුණාත්මක භාවයේ

පිරිහීමක් තිබෙනවා. හැම ක්ෂේත්‍රයකම පිරිහීමක් අපි දකිනවා. මෙහිදී ඒ පිරිහීම වළක්වා ගන්න පුළුවන්කම හැකියාව ලැබෙන්නේ, අපේ ගුරුවරුන්ට සහ ආගමික නායකයන්ට කියන මතක් කිරීම අපි කරනවා. ඒ නිසා ඒ ගුරුවරු ඉතාම ගුණාත්මක වශයෙන් සංවර්ධනය කිරීම තුළ අපේ මුළු සමස්ත සමාජයම යහපත් කිරීම සඳහා කැප වෙමුයි කියන එක මතක් කිරීම කරමින්, මේ විවාදයට සම්බන්ධ වූ සියලුම දෙනාට අපේ ආදරය, ගෞරවය, ස්තුතිය පිරිනමමින් නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමිය**
Hon. Presiding Member

ඇත්තෙන්ම හොඳ යෝජනාවක් සිසිර ජයකොඩි ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ගෙනාවා. ඒ පිළිබඳව කවුරුත් සතුටු වෙනවා. විෂයානුබද්ධ ගුරුවරු මේ පළාත් සභාවේ පාසල් තුළට තවදුරටත් රැගෙන එනවා නම් මම හිතන්නේ ළමයින්ගේ අධ්‍යාපනයට ලොකු සේවාවක් වෙනවා. විශාල ගුරු හිඟයක් තිබිලා, ඒ ගුරු හිඟය අවම වීම ගැන අපි සතුටු වන අතර අපි ප්‍රාර්ථනා කරනවා, අනාගතයේදී ඒ විෂයයන් අනුව ගුරුවරුන් අඩුපාඩුවක් තිබේ නම් එයත් හරිගස්වන්නට අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමාට සහාය, ශක්තිය ලැබේවායි කියලා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

# කල් තැබීමේ යෝජනාව
# ADJOURNMENT

**ගරු සුනිල් ජයමිණි –** සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.55 ට, 2013 ජූලි මස 09 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 12.55 p.m till 9.30 a.m. on 09.07.2013.*